# ඇගෙන් තොර ලොවක් ?



## අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම : මානව හිමිකම් න්‍යාය පත්‍රයක්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2018 ජාත්‍යන්තර කාන්තා දිනය

# අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම : මානව හිමිකම් න්‍යාය පත්‍රයක්

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**2018 ජාත්‍යන්තර කාන්තා දිනය**

# පටුන


| | පිටු |
|---|---|
| 1.0.හැදින්වීම | 2 |
| 2.0. ප්‍රධාන කාර්යාලය | 3 |
| 2.1. ප්‍රාදේශීය කාර්යාලය | |
| 2.1.1. .අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය | 12 |
| 2.1.2. බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය | 15 |
| 2.1.3. මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය | 16 |
| 2.1.4. අම්පාර ප්‍රාදේශීය කාර්යාලය | 18 |
| 2.1.5. ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය | 19 |
| 2.1.6. කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලය | 20 |
| 2.1.7. මාතර ප්‍රාදේශීය කාර්යාලය | 21 |
| 2.1.8. යාපනය ප්‍රාදේශීය කාර්යාලය | 22 |
| 2.1.9.මහනුවර ප්‍රාදේශීය කාර්යාලය | 23 |
| 3.0.අවිධිමත් රැකියා ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ පොදු ගැටළු /අභියෝග | 25 |
| - පොදු නිරීක්ෂණ හා නිගමන | |
| 4.0. නිර්දේශ | 28 |
| ඇමුණුම් i - **ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම දායකත්වය** | 30 |
| ඇමුණුම් ii- 2017 ජාත්‍යන්තර කාන්තා දිනය සැමිණීමේ ලේඛණය | 37 |

# 1.0.හැදින්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් "ඇගෙන් තොර ලොවක්" තේමාව යන යටතේ 2016 වසරේ දී ජාත්‍යන්තර කාන්තා දිනය සමරනු ලැබූ අතර එහිදී ග්‍රාමීය කාන්තාවන්ගේ ගැටළු වෙනුවෙන් පෙනී සිටින ලද ප්‍රාදේශීය කාන්තා නායිකාවන් 8 දෙනෙකුගේ අත්දැකීම් පිළිබඳ  අදහස් සාකච්ඡාවට ලක් කරමින් ජාතික තලයේ දී ඔවුන්ව ඇගයීමකට ලක් කරනු ලැබීය.

එකී වැඩසටහනේ දිගුවක් ලෙස මෙම 2017 වසරේදී එකී තේමාව යටතේ ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව වටමේස සාකච්ඡාවක් සංවිධානය කරනු ලැබුවේ අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ ගැටළු, අභියෝග පිළිබඳ සාකච්ඡා කරමින් ඒ පිළිබඳව අදාළ බලධාරීන් දැනුවත් කොට ඒ සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට රජය දැනුවත් කිරීමේ පියවර ගැනීම සඳහාය.

ඒ අනුව කොමිෂන් සභාවේ කොළඹ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල 10 ය විසින්  "ඇගෙන් තොර ලොවක්"යන තේමාව යටතේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය,විවිධ ගෘහ කර්මාන්ත ක්ෂේත්‍රයන් වැනි විවිධ අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයන් හී නියුතු කාන්තාවන් තම රැකියා ක්ෂේත්‍රයන් හී මුහුණ දෙන අභියෝගයන්,ගැටළු සහ ජයග්‍රහණයන් පිළිබඳ අදහස් දැක්වීම් සිදුකරනු ලැබීය. මෙහිදී මූලික අවධානය අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයන් වෙත යොමු කළද යම් විධිමත් ක්ෂේත්‍ර  එනම් නිදහස් වෙළඳ කලාප ශ්‍රමිකයින්, වතුකර ශ්‍රමිකයින් හා සංක්‍රමණික සේවකයින් ආශ්‍රිත අයිතීන් පිළිබඳ ගැටළු නිරන්තරයෙන් ඉස්මතු වන බැවින් හා එම ගැටළු වලට පාදක වූ හේතුව ලෙස එම ක්ෂේත්‍රයන් පිළිබඳ ඇති දුර්වල නියාමන පද්ධතීන් බැවින් එම ක්ෂේත්‍ර පිළිබඳව ද අපගේ අවධානය මෙහිදී යොමු කරන ලදී. මෙම වටමේස සාකච්ඡාවන්  සඳහා රජයේ නිළධාරීන් ද සිවිල් සංවිධාන නියෝජිතයන්ට ද අප ආරාධනා කළ අතර ඔවුන් ද එහිදී තම අදහස් දැක්වීම් සිදු කරනු ලැබිය.

එකී වටමේස සාකච්ඡාව තුල දී  හා ප්‍රාදේශීය කාර්යාල මගින් පැවැත්වූ වට මේස සාකච්ඡා තුලදී අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්,අනෙකුත් රාජ්‍යය ආයතන හා සිවිල් සංවිධාන නියෝජිතයන් විසින් ඉදිරිපත් කරනු ලැබූ අදහස් මෙන්ම  යෝජනාද මෙම වාර්තාවට අන්තර්ගත වී ඇති අතර, අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම තුලින් ඇති විය යුතු ප්‍රගමනය වෙනුවෙන් අදාළ රාජ්‍ය ආයතන වෙත 1996 අංක : 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 හා 11 වන වගන්තීන්  මගින් නියමිත බලතල ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන නිර්දේශයන් ද මෙකී වාර්තාවට ඇතුලත් වී ඇත.

මෙහිදී, කොමිෂන් සභාවේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ අදාළ ප්‍රතිපත්ති රාජ්‍ය ආයතන විසින් නිර්මානය කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී මෙහි ඉදිරිපත් කොට ඇති නිදේශ සැලකිල්ලට ගනිමින් කටයුතු කිරීමට පොළඹීමත්, ඒ තුලින් අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ අභිවෘද්ධිය සාක්ෂාත් කිරීමත්ය.

## 2.0 ප්‍රධාන කාර්යාල වටමේස සාකච්ඡාව - ආරම්භක අදහස්

ජාත්‍යන්තර කාන්තා දින ප්‍රධාන වැඩසටහන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය මගින් සංවිධානය කරන ලද අතර එය කොළඹ 07, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ, බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානයේ පැවැති අතර එහි ප්‍රධාන ආරාධිත අමුත්තා වූයේ හිටපු ජනාධිපති **ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියයි.** මේ සඳහා විවිධ වෘත්තීන් නියෝජනය කරමින් පුළුල් කාන්තා සහභාගීත්වයක් දක්නට ලැබීය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් සහ ඒ සමාන වෘත්තීන් හි නියුතු කාන්තාවන් සහභාගී කරගනිමින් ඔවුන්ගේ ගැටළු සහ අභියෝග පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය.

මෙම වටමේස සාකච්ඡාව විවිධ රාජ්‍ය ආයතන එනම් අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා පෞද්ගලික බැංකු නියෝජිතයන්, විද්වතුන්, තානාපතිවරුන් හා තානාපති කාර්යාල නියෝජිතයින්, එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන නියෝජිතයන් හා රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයන් ගේ සහභාගිත්වයෙන් පැවැත්විය.

ජාත්‍යන්තර කාන්තා දින ප්‍රධාන වැඩසටහනට පැමිණි පිරිස පිළිගැනීමෙන් අනතුරුව වැඩසටහන පිළිබඳ හැඳින්වීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනී **ආචාර්ය දීපිකා උඩගම මහත්මිය** විසින් සිදු කරනු ලැබීය.

එහි දී ඇය අවධාරණය කරනු ලැබුවේ සෑම අයෙක්ම මානව වර්ගයාගේ කොටස්කරුවන් සේ සමාන ගෞරවනීය ජීවිතයකට ඇති අයිතිය සුරක්ෂිත කළ යුතු බවයි. නිවසින් පිටත ශ්‍රමය සපයන කාන්තාවන් බහුතරයක් අද වන විට සමාජයේ දක්නට ලැබෙයි. පසුගිය වසරේ කාන්තා දිනයේ දී ග්‍රාමීය ප්‍රජා නායිකාවන් හා අදහස් බෙදා හදාගත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙවර රටේ ආර්ථිකයට විශාල වශයෙන් දායකත්වයක් සපයනු ලබන අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන කාන්තාවන්ගේ ජීවිතයේ ගැටළු, අභියෝග, ජයග්‍රහන පිළිබඳ අදහස් හුවමාරු කර ගනු ලබන බව දැක්විය. මේ පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කරලීම මෙහි ප්‍රධාන පරමාර්ථය වන බව ප්‍රකාශ විය. ලංකාවේ කාන්තාව දෙලොවක් අතර ජීවත් වන බව ඇය දක්වයි. මන්ද සමහර අංශවලින් ඉතා විශාල ජයග්‍රහන ලබන කාන්තාවෝ තවත් අංශවලින් සම්ප්‍රදායන්ට කොටු වී ජීවත් වීමයි.

කාන්තාව අධ්‍යාපන අංශයෙන් ලබා ඇති ජයග්‍රහන ඉතා විශිෂ්ඨය. එසේම මාතෘ සෞඛ්‍ය අංශයේ ද ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටියි. නමුත් උසස් අධ්‍යාපනය අවසන් කළ කාන්තාව ඉන් පසුව පොදු ජීවිතයෙන්, විශේෂයෙන් ශ්‍රම බලකායෙන්, අතුරුදහන් වීමක් දක්නට ලැබේ.

2012 සංඛ්‍යා ලේඛන අනුව ශ්‍රී ලාංකීය ශ්‍රම බලකාය තුල කාන්තා දායකත්වය 35%ක් පමණ වන නමුත් විශ්ව විද්‍යාල සිසුන්ගෙන් 60%ක් පමණ කාන්තාවන් වේ. එහෙයින් එම පිරිස ආර්ථිකයට හා රටේ සංවර්ධන කටයුතුවලට දක්වන දායකත්වය පැහැදිළි නැති බැවින් අවතක්සේරුවට ලක්ව ඇත.

වැඩි කාන්තා දායකත්වය අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ තිබෙන බව පෙනී යයි. එහිදී කම්කරු අයිතිවාසිකම් පිළිබඳ තත්වය සතුටුදායක මට්ටමේ නොමැත. එසේම ආර්ථිකයේ කොඳුනාරටියවන් මෙම කාන්තාවන් වතු සේවිකාවන් හා කර්මාන්ත ශාලා සේවිකාවන් ලෙස අඩු වැටුපට ශ්‍රමය සපයයි.

තවද කාන්තාවන්ට එරෙහි ලිංගික හිරිහැරයන් ද ලංකාව තුල වැඩි වශයෙන් දක්නට ලැබේ. පොදු ප්‍රවාහන සේවයේ මෙන්ම රැකියා ස්ථානවලද මෙය බහුලව දක්නට ලැබෙන අතර කාන්තාවට එරෙහි සමාජ ආකල්ප ශ්‍රම ක්ෂේත්‍රයේ වැඩි වශයෙන් දක්නට ලැබේ. උදාහරණ ලෙස පුරුෂ පක්ෂයට වඩා කාන්තා ව්‍යවසායකයින්ට ණය ලබා ගැනීම දුෂ්කර වේ.

කාන්තාව අධ්‍යාපනය ලැබුවද ගතානුගතික රාමුව තුල කොටු වී එකී අධ්‍යාපනයේ ප්‍රතිලාභ භුක්ති විදීමට සිදු වී තිබෙන බව ඇය අවධාරණය කරනු ලැබීය. මෙහිදී ඇය දැක්වූයේ සමහර පෞද්ගලික නීති මෙන්ම ඉඩම් සංවර්ධන ආඥාපනත වැනි ඉඩම් නීති වෙනස්කමට ලක් විය යුතු බවයි.

මෙවර කාන්තා දින වැඩසටහනේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ **හිටපු ජනාධිපතිනී ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මහත්මිය** අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ ශ්‍රී ලංකාවේ වැඩිම විදේශ විනිමය උපයන කේෂ්ත්‍රයක් වන ඇගළුම්, තේ කර්මාන්තය තුල හා විදේශගත ශ්‍රමිකයන් ලෙස කාන්තාවන් ආර්ථිකයට විශාල දායකත්වයක් දැක්වුවද ඔවුන්ට සමාජයේ පවතින පිළිගැනීම පිළිබඳ ගැටළුවක් පවතින බවයි.

තවද ඇය සඳහන් කරනු ලැබුවේ කාන්තා දේශපාලන සහභාගිත්වය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බවත් ඒ සඳහා සමාජමය වගකීමක් ඇති බවත්ය.

එසේම හිටපු ජනාධිපතිතුමිය වැඩිදුරටත් සඳහන් කරනු ලැබුවේ ශාරීරික හා ලිංගික හිංසනයන්ට භාජනය වන කාන්තාවන්ගේ සුරක්ෂිතභාවය ඉතා වැදගත් බවත් ඒ සඳහා බොහෝ ප්‍රතිපත්තීන් හා නීතීන් සකස් විය යුතු බවත්ය.

ඇය දක්වනු ලැබුවේ සංචාරක කේෂ්ත්‍රය තුල කාන්තාවන්ට නිසි පුහුණුවක් ලබා දෙන්නේ නම් ඔවුන්ට රැකියා අවස්ථා රාශියක් ඇති බවයි. තවද හෙදියන් ලෙස දරුවන්, අබාධ සහිත පුද්ගලයන් හා වැඩිහිටියන් රැකබලා ගැනීමට නිසි පුහුණුවීම් සිදු කරන්නේ නම් එයද දවසේ පැය කිහිපයක් පමණක් කටයුතු කළ යුතු කාන්තාවන්ට පහසු රැකියාවක් වනු ඇති බවයි.

තවද සංක්‍රමණික සේවයන්ගේ පවුල් බිඳවැටීමේ සමාජ ගැටළුව ද මෙහිදී ඇය අවධාරණය කරනු ලැබිය. රජය 2016 – 2020 ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනයන්ට එරෙහි ජාතික ප්‍රතිපත්තියක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට ඇති අතර එය ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කරනු ලබයි. තවද 2016 වසරේදී පාර්ලිමේන්තුව විසින් සෑම පළාත් පාලන ආයතනයකටම කාන්තා නියෝජය 25%ක් විය යුතු බවට විධි විධාන සකස් කරනු ලැබූ නමුත් එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට කටයුතු සිදු කල යුතු බවද සඳහන් කළාය.

සංහිඳියා ක්‍රියාවලිය සඳහා කාන්තාවන් දායක කර ගැනීම මගින් එය වඩාත් සාර්ථක විය හැකි බව ඇගේ මතයයි. යුද්ධයෙන් පීඩාවට පත් උතුරේ මෙන්ම දකුණේ කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම ඉතාමත් වැදගත් අතර ඒ සඳහා ජාතික සංහිඳියා කාර්යාංශය සමග පුළුල් වැඩපිළිවෙලක් සකස් කරමින් පවතින බව හිටපු ජනාධිපතිතුමිය වැඩිදුරටත් සඳහන් කරනු ලැබීය.

එහිදී ස්වයං රැකියා නිර්මාණය, ණය පහසුකම් ලබා දීම වැනි අති විශාල වැඩ කොටසක් සිදු කරමින් පවතියි. නමුත් ඒ ප්‍රදේශවල කාන්තාවන් රජයේ නිලධාරීන් විසින් සේවාවන් ලබා දීමේ දී පවා ලිංගික හා වෙනත් හිරිහැර සිදු කරනු දක්නට ලැබෙන බව එතුමිය දැක්වීය.

තවද යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් හා ළමුන්ගේ මානසික සෞඛ්‍ය නගා සිටුවීමට වැඩ පිළිවෙලක් ද ජාතික සංහිඳියා කාර්යාංශය ආරම්භ කර ඇති බවත් ඇය වැඩිදුරටත් ප්‍රකාශ කළාය.

## වටමේස සාකච්ඡාව

2017 ජාත්‍යන්තර කාන්තා දින වටමේස සාකච්ඡාව ආරම්භ කරමින් එය මෙහෙයවීම **ආචාර්ය හරිනි අමරසූරිය** විසින් සිදු කරනු ලැබිය. පහත සඳහන් කාන්තාවන් විසින් ඔවුන්ගේ ක්ෂේත්‍රයන්ට අදාළව අභියෝග ජයග්‍රහණ හා ගැටළු පිළිබඳ සාකච්ඡා කරනු ලැබීය.

1. රෝෂණී වීරසිංහ මහත්මිය - ඇඟලුම් ක්ෂේත්‍රය(කටුනායක)
2. කේ ටී සෝමලතා මහත්මිය - ඌව වෙල්ලස්ස කාන්තා සංවිධානය - කෘෂිකාර්මික ක්ෂේත්‍රය(මොනරාගල)
3. මාරියා ජෙයදාස් ලක්ෂ්මි මහත්මිය - තල් හා කොහු ආශ්‍රිත නිෂ්පාදන(මඩකළපුව)
4. එම් පී චන්ද්‍රානි - හම්බන්තොට කාන්තා මහා සංගමය නියෝජනය කරමින් ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය භාවිතා කළ හැකි ආකාරය(හම්බන්තොට)
5. ආනන්දි දේවේන්ද්‍ර කුමාරි - වතු ක්ෂේත්‍රය හා ගෘහ සේවිකාවන් නියෝජනය කරමින් (නුවරඑළිය)

### 1. කේ ටී සෝමලතා මහත්මිය (කෘෂිකාර්මික ක්ෂේත්‍රය)

වටමේස සාකච්ඡාව ආරම්භ කරමින් මුලින්ම අදහස් දැක්වූයේ **කේ ටී සෝමලතා** මහත්මියයි. ඇය අදහස් දක්වමින් කියා සිටියේ වෙල්ලස්ස උක්ගොවීන්ගේ ගැටළුවත් සමඟ ඒ ප්‍රදේශයේ කාන්තාවන් විසින් නීතිය, ආර්ථික, දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් විමටත් ක්‍රියාකාරී වීමටත් වෙල්ලස්ස කාන්තා සංවිධානය පිහිටුවනු ලැබූ බවත් එහි ක්‍රියාකාරී සාමාජිකාවක් ලෙස ඇය කටයුතු කරනු ලබන බවත්ය. ඇය සඳහන් කරනු ලැබූවේ වර්තමාන සමාජ ක්‍රමය තුල ගොවිතැන් කරන පිරිසට අඩු සැලකිල්ලක් දක්වන බවත් උදාහරණ ලෙස රජයේ කාර්යාල, පොලිස් ස්ථාන ආදියේ දී මෙන්ම දරුවන් පාසලට ඇතුලත් කිරීමේදීත් ගොවිතැන් කරනු ලබන පුද්ගලයින් කොන් කිරීම සිදු කරනු ලබන බවයි.

නමුත් අවිධිමත් සුළු ආහාර නිෂ්පාදකයින් ලෙස කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය තුල 75% කට වඩා දායකත්වය දක්වන්නේ මෙම පිරිසයි. කෘෂිකර්මාන්තයේ දී සම්මාන ලබාදීම් වලදී කාන්තාවන් නොසලකා හරින බවත් කාන්තාවන්ගේ ශ්‍රම දායකත්වය ඇගයීමට ලක් නොවන බවත් ඇය දක්වීය.

කෘෂිකාර්මික කාන්තාවන් දවසක් තුල සිදු කරන රාජකාරී ප්‍රමාණය ඉතා විශාල බවත් එවන් කාන්තාවන්ගේ ආර්ථිකමය දායකත්වය කිසිදු මොහොතක සංඛ්‍යා ලේඛන වලට නොගන්නා බවත් ඇය අවධාරණය කරනු ලැබීය.

ඇය තවදුරටත් දැක්වූයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුල වෙළඳ පොළවල්හි භූමින් ලබා ගැනීමේ දී කාන්තාවන්ට පිරිමින් හා තරඟ කිරීමට සිදු වන බවත් එකී තරඟයේ දී පිරිමින්ට එම භූමිය ලබා ගැනීමේ වැඩි ඉඩකඩක් පවතින බවත්ය. එසේම මිල ගණන් සඳහා කේවල් කිරීමේදී ද පිරිමින් නැවතත් කාන්තාවන්ට අවස්ථාව නොදීම දක්නට ලැබෙන බව දක්වන ඇය සංවිධානගත වන විට යම් කිසි පිළිගැනීමක් හා කේවල් කිරීමේ හැකියාව ලැබෙන බවත් දක්වා සිටියි.

ඇය වැඩිදුරටත් අවධාරණය කරනු ලැබුවේ වයස අවුරුදු 18ට අඩු දරුවන් විශාල පිරිසක් නීත්‍යානුකූල විවාහයන්ට ඇතුළත් නොවී එකට ජීවත් වන බවයි. මෙය ගැටළුවක් බවත් ගැහැණු දරුවන් ඉන් අපහසුතාවයකට ලක්වන බවත්ය. තවද කෘෂිකාර්මික ප්‍රදේශ තුල ඉක්මන් විවාහවීම් බහුල අතර මොවුන් ඉක්මනින් දික්කසාද වීම ද සිදු කරයි. එහිදී වැඩි දික්කසාද නඩු හා නඩත්තු නඩු ප්‍රමාණයක් කෘෂිකාර්මික ප්‍රදේශ තුල දක්නට ලැබේ.

ඇය දැක්වූ පරිදි කෘෂිකාර්මික ප්‍රදේශයක් වන මොනරාගල ඇතුළු ඌව පළාතේ බොහොමයක් ඉඩම්වල අයිතිය කාන්තාවන්ට නොමැති බවත් ඉඩම් සංවර්ධන ආඥා පනත අනුව පිරිමින්ට ඉඩම් හිමිවීම නිසා ඉඩමේ වගා කරන බෝගය පිළිබඳවත් තීරණය ගැනීමේ අයිතිය කාන්තාවන්ට නොමැති බවත් හරි හෝ වැරදි ස්වාමිපුරුෂයා විසින් වගා කිරීමට තීරණය කරන බෝගය ඇය වගා කළ යුතු බවත්ය.

ඇය දක්වන්නේ පිරිමින් හා කාන්තාවන් සමාන අයිතිවාසිකම් සෑම විටම හිමිවිය යුතු බවයි.

එසේම පළාත් පාලන ආයතන තුල කාන්තා නියෝජනය සඳහා 25%ක කෝටාවක් ලබා දුන්නද ප්‍රාදේශීය සභාව, පළාත් සභාව හෝ පාර්ලිමේන්තුව තුල කාන්තා නියෝජනයන් අවම බවත් සිටින කාන්තා නියෝජිතයන් ද කෘෂිකාර්මික කාන්තාවන්ගේ ගැටළු පිළිබඳ අවධානය යොමු නොකරන බවත් ය.

තවද කෘෂිකාර්මික කාන්තාවන් දේශපාලනයට ඒමට ඇති ඉඩකඩද අවම බව ඇය වැඩිදුරටත් සඳහන් කළාය. ඇය දැක්වූයේ කාන්තාවන් සුළු පිරිසක් පවතින ක්‍රමයකින් වෙනස් කළ නොහැකි බවත් විශාල සංවිධාන ලෙස සංවිධාන ගතව වෙනස් වීම් සිදු කළ යුතු බවත්ය. ඒ සඳහා පවතින මූල්‍ය ප්‍රතිපාදන අවම වීම හේතුවෙන් බොහෝ වැඩසටහන් ඇන හිට ඇති බවත් ඇය දැක්වීය. තවද ග්‍රාමීය ප්‍රදේශයන්ට සම්පත් බෙදී යාමේ විෂමතා පවතින බැවින් ඒ පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු බව ප්‍රකාශ කළාය. එහිදී කෘෂිකාර්මාන්තය පහළ තැනක් ලෙස ශ්‍රේණිගත වීම නිසා අවශ්‍ය සම්පත් නොලැබීම දක්නට ලැබෙන බවත් ඒ පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින් දැනුවත් කළ යුතු බවත් අවධාරණය කරනු ලැබීය.

තවද ඇය සඳහන් කරනු ලැබුවේ බොහෝ බහුජාතික සමාගම් මොනරාගල ප්‍රදේශයේ මහා පරිමාණ කෘෂිකාර්මික කටයුතු වල නිරතවන බවත් එම ආහාර ද්‍රව්‍ය සඳහා ඉතා බහුලව රසායනික පොහොර භාවිතා කරන බවත් ඒවා මිනිස් සිරුරට ඉතාමත් අහිත කර බවත් ය. ඒ අනුව ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කළ යුතු මෙන්ම සාමාන්‍ය ජනතාව සතු කෘෂිකාර්මික ඉඩම් බහුජාතික සමාගම්වලට පැවරීමේ දී එම ජනතාවගේ අයිතීන් තහවුරු කිරීමට රජයන් පියවර ගත යුතු බවත් ඇය අවධාරණය කරනු ලැබීය.

තවදුරටත් සඳහන් කරන ලද්දේ ණය ලබා දෙන ආයතන විශාල සංඛ්‍යාවක් කෘෂිකාර්මික ග්‍රාමීය ප්‍රදේශවලට පැමිණ බලෙන් මෙන් ණය ලබා දුන්නද එයින් දැන් කාන්තාවන් දැඩි පීඩනයකට පත්ව ඇති බවයි. මන්ද ආයතන කීපයකින් සැලසුමකින් තොරව ණය ලබා ගෙන ඒවා ගෙවා ගැනීමේ දී ගැටළු ඇති වන බවයි. එහිදී ඇය මහ බැංකුව විසින් ලබා දෙන නවතම ණය යෝජනා ක්‍රමය වන ස්වශක්ති ජාතික ණය යෝජනා ක්‍රමය කෘෂිකාර්මික ප්‍රදේශවලට ගලා නොයාමත් එම පහසුකම් සඳහා ප්‍රවේශවීමේ දී ගැටළු පවතින බවත් සඳහන් කරයි. මන්ද දැන්වීම් වල සඳහන් ක්ෂණික දුරකථන අංක වලට කථා කොට ඒ හා සම්බන්ධවීමේ ගැටළු පවතියි. එසේම විද්‍යුත් ලිපිනයන් හරහා සම්බන්ධ වීම ග්‍රාමීය ජනතාවට දුෂ්කර වන්නේ ඒ පිළිබඳ අවබෝධය නොමැති බැවිනි. ඒ හේතුව නිසා සෑම ගමකටම යා හැකි පරිදි සරල ක්‍රමක් මෙහිදී සකස් විය යුතු බව ඇය දැක්වීය.

ග්‍රාමීය කාන්තාවන් බැංකුවකින් ණයක් ගැනීමේ දී ඔප්පුවේ අයිතිය ස්වාමි පුරුෂයාගේ නමට වීම හේතුවෙන් අදාළ ණය නොලැබී යයි. සමෘද්ධ බැංකු මගින් ලබා දෙනු ලබන ණය දේශපාලන බලපෑම් මත ලබා දීමක් ද සිදු වේ. මෙහිදී සමෘද්ධි බැංකු මගින් ලබා දුන් රු.50,000/-ක ණය යෝජනා ක්‍රමය තුල අදාළ කාන්තාවන් නොදැන කාන්තාවගේ නමට ස්වාමිපුරුෂයන් විසින් ණය ලබා ගෙන ඇති අවස්ථා ඇත. ඒ මුදල් පසුව ස්වාමිපුරුෂයන් විසින් නිසි කළමනාකරණයකින් යුතුව භාවිතා කිරීමක් ද සිදු නොකරයි.

2. **ආනන්දි දේවේන්ද්‍ර කුමාරි මහත්මිය (වතු කේෂ්ත්‍රය හා ගෘහ සේවිකාවන් නියෝජනය කරමින්)**

මීළඟට වට මේස සාකච්ඡාව සඳහා අදහස් දක්වනු ලැබුවේ **ආනන්දි දේවේන්ද්‍ර කුමාරි** මහත්මියයි. ඇය වතු සේවිකාවක් ලෙස මෙන්ම ගෘහ සේවිකාවක් ලෙසද කටයුතු කර ඇති අතර වෘත්තීය සමිති නායිකාවක් ලෙසද කටයුතු කරනු ලබයි.

ඇය දක්වනු ලැබුවේ වතු සේවකයින් රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් දැක්වුවද ඔවුන්ට ප්‍රමාණවත් පහසුකම් නොලැබෙන බවත් හා ඉතා අඩු වැටුපකට සේවය කිරීමට සිදු වන බවත්ය. එම වැටුප මගින් ඔවුන්ට තම පවුල් නඩත්තු කිරීමට හැකියාවක්වත් නොමැති බවත් ඇය අවධාරණය කරනු ලැබීය.

එසේම රජය මගින් ලබා දෙන ආධාර හා ප්‍රතිලාභ ලබා ගැනීමේ දී ද ඔවුන් ගැටළු වලට මුහුණ පාන බව සඳහන් කරනු ලැබීය. බොහෝ සේවකයින් විශේෂයෙන් කාන්තාවන් තමන් සේවය කරනු ලබන වත්තෙන් පිටට ගොස් නැති අතර ඔවුන්ට කොළඹ පිහිටා ඇති රජයේ කාර්යාල වෙත යාමේ අපහසුතාද පවතියි. මෙම වතු කම්කරුවන්ට තම වැටුප වැඩිකර ගැනීමට අවශ්‍ය නම් ඔවුන්ට උද්සෝෂණ හෝ වැඩවර්ජන කිරීමට සිදු වේ. තම අදහස් හා ගැටළු ඉදිරිපත් කිරීමට ඔවුන්ට නිසි අවස්ථාවක් ද නොමැති අතර එම වතු සේවකයන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කරලීම සඳහා කිසිදු රාජ්‍ය ප්‍රතිපාදනයක් දක්නට නොලැබේ. විශේෂයෙන් වතු ආශ්‍රිත කාන්තාවන් ගෘහ සේවිකාවන් ලෙස විශාල ලෙස රැකියා කරන අතර ඔවුන්ගේ ආරක්ෂාව සඳහා නිසි නීති පද්ධතියක් ද දක්නට නොලැබෙන බව ඇය සඳහන් කළාය.

තවද තේ දළු නෙලන කාලය තුල ඔවුන් වෙනත් කාර්යන් සඳහා යෙදවීම මගින් දවසේ දළු කැඩිය යුතු ඉලක්කය සපුරා ගත නොහැකිවීම නිසා දිනට නියමිත වැටුප අහිමි වී යෑම සිදුවේ.

මෙහිදී පහත යෝජනාවන් පිළිබඳ සාකච්ඡාවේදී සලකා බලන ලදි:

- වැවිලි කේෂ්ත්‍රයේ මූලික වැටුප් පිළිබඳ ක්‍රමවේදයක අවශ්‍යතාව
- වතු සේවකයින් වෙනුවෙන් අදාළ වන සියළු නීතීන් ක්‍රියාත්මක වීම
- කම්කරු දෙපාර්තමේන්තුවේ ක්‍රියා වලින් වෙනස් විය යුතු විම
- නිලධාරීන් විසින් වතු සේවකයින්ගේ තත්වය තේරුම් ගනිමින් ඒ පිළිබඳ සංවේදී විය යුතුය.
- සේවක වෘත්තීය සමිති පක්ෂ දේශපාලනයෙන් ඉවත් වීම
- ජනතා උපදේශන කමිටු සඳහා සහභාගීවීමට කාන්තාවන්ට අවස්ථාවක් නොමැති විම
- නීති සම්පාදකයින් කොළඹ පමණක් නොව ප්‍රාදේශීයවද ක්‍රියාත්මක විය යුතු වීම
- වතු කේෂ්ත්‍රයට අදාළව නව නීති සකස් කිරීම

මෙහිදී ආර්ථික කේෂ්ත්‍රයේ වතු කාන්තාවන් මුහුණ දෙන බොහෝ ගැටළු ඇතිවීමට අදාළ වතු පෞද්ගලිකරණය කිරීම ද එක් හේතුවක් වී ඇති බව සඳහන් විය.

එසේම නුවර එළිය දිස්ත්‍රික්කය තුල මන්ද පෝෂණ තත්වය දක්නට ඇති අතර ළමා අපචාර සිද්ධීන් විශාල ලෙස වාර්තා වේ.

තවද මෙකී වතු කම්කරුවන්ට භාෂා ගැටළු ද පවතින අතර නීතීන් හා ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක වීමේ දී පුද්ගලයන්ගේ වෙනස්කම් පිළිබඳ නොසලකා සමාන ආකාරයෙන් ක්‍රියා කිරීම රාජ්‍ය නිළධාරීන්ගේ වගකීම බව ඇය අවධාරණය කරනු ලැබීය.

### 3. රෝෂණී වීරසිංහ මහත්මිය (ඇඟලුම් ක්ෂේත්‍රය)

ඇඟළුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුතු කාන්තාවන් නියෝජනය කරමින් වටමේස සාකච්ඡාව සඳහා **රෝෂණී වීරසිංහ** මහත්මිය සම්බන්ධ විය. ඇය ඇඟළුම් කර්මාන්ත ආයතනයක සේවය කරන අතර රාජ්‍ය නොවන සංවිධානයකට සම්බන්ධ වී ඇඟළුම් ක්ෂේත්‍රයේ සේවකයින්ගේ සුභ සාධනය වෙනුවෙන් කටයුතු කරනු ලබයි. ඇය අදහස් දක්වමින් කියා සිටියේ නිදහස් වෙළඳ කලාපයේ සේවය කරන කාන්තාවන්ට බොහෝ විට සලකන්නේ ඉතා පහත් ආකාරයට වන අතර ඔවුන මහ මගදී නේවාසිකාගාර වලදී මෙන්ම රැකියා ස්ථාන වලදී ද විවිධ හිංසනයන්ට ලක් වන බවයි.

තවද රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත සමහර කර්මාන්ත ශාලාවල දීර්ඝ කාලයක් සේවය කරන කාන්තාවන්ට දරුඵල අහිමි වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. එසේම 62%ක් නිදහස් වෙළඳ කලාප කාන්තාවන් රක්ත හීනතාවයෙන් පෙළෙන අතර මන්ද පෝෂණය ද මෙහිදී දක්නට ලැබේ. තවද නේවාසිකාගාර ආශ්‍රිත ප්‍රදේශවලට බලපාන ස්වභාවික ව්‍යසනයන් හිදී රජයෙන් ලබා දෙන සහනාධාර මෙම කාන්තාවන්ට හිමි නොවන බවත් ඇය වැඩිදුරටත් දක්වයි. එසේම දරුවන්ට කිරි ලබා දීමේ දී කිරි පැය ලබා ගැනීමේ දී පවතින ගැටළු ගැනද ඇය සභාවේ අවධානය යොමු කරනු ලැබීය.

ඇගේ අදහස් දැක්වීම අවසන් කිරීමට ප්‍රථම ඇය සඳහන් කරනු ලැබුවේ මැන්පවර් සේවකයින්ගේ රැකියාවේ සුරක්ෂිතභාවය පිළිබඳ පවතින ගැටළු පිළිබද අවධානය යොමු විය යුතුවා මෙන්ම රටේ ආර්ථිකයට වැඩිදායකත්වයක් දරන නිදහස් වෙළඳ කලාපයේ සේවිකාවන්ට නිසි ඇගයීමක් හිමි විය යුතු බවයි. තවද මෙහිදී **රෝෂණී වීරසිංහ** මහත්මිය දක්වා සිටියේ නිදහස් වෙළඳ කලාපයේ කාන්තාවන් ඡන්දය ලබා දීමට නිවාඩු ලබා ගැනීමේ ගැටළු නිසා ගම් ප්‍රදේශවලට නොයන බැවින් නිදහස් වෙළඳ කලාපවල සේවය කරන කාන්තාවන්ට ඡන්දය භාවිතා කිරීමේ අයිතිය ද අහිමි වී ඇති බවයි. ඇය විමසා සිටියේ ඔවුන් රැකියාව සිදු කරන නිදහස් වෙළඳ කලාප අභ්‍යන්තරයේ ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවිය නොහැකි ද යන්නයි.

### 4. එම්. ලක්ෂ්මී මරියදාස් මහත්මිය (තල් හා කොහු ආශ්‍රිත නිෂ්පාදන)

මඩකළපුව ප්‍රදේශයේ තල් හා කොහු ආශ්‍රිත නිෂ්පාදනයන් හී නිරතවන **එම්. ලක්ෂ්මී මරියදාස් මහත්මිය** මී ළගට වටමේස සාකච්ඡාව සඳහා අදහස් දැක්විය.

ඇය මෙහිදී යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් පිළිබද අවධානය යොමු කරනු ලැබීය. ඇය සඳහන් කරනු ලබන්නේ කාන්තාවන් ස්වයං රැකියාවල නිරත වීමට ධෛර්මත් කළ යුතු බවයි. තවද ඇය දැක්වූයේ බොහෝ විදෙස්ගත සංක්‍රමණික සේවක කාන්තාවන් නැවත නිවෙස් වලට පැමිණෙන්නේ මානසික පීඩනයට පත්ව හා නිසි වැටුප් නොමැතිව බවයි.

ප්‍රතිපත්ති හා නීතීන් ක්‍රියාත්මක කිරීමේ දී විවිධ රැකියා වල නිරත වන කාන්තාවන් සිටින බැවින් ඒ පිළිබඳව ද අවධානය යොමු කළ යුතු බව ඇගේ අදහසවේ.

### 5. එම් පී චන්ද්‍රානි මහත්මිය (හම්බන්තොට කාන්තා මහා සංගමය නියෝජනය කරමින් ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමය භාවිතා කළ හැකි ආකාරය)

හම්බන්තොට කාන්තා මහා සංගමයේ පුහුණු හා සජීවිකරණ අංශයේ සහකාර **එම් පී චන්ද්‍රානි මහත්මිය** මෙහිදී දැක්වූයේ ගැමි ශක්ති බැංකු වැඩසටහන යටතේ ග්‍රාමීය කාන්තාවන් වෙනුවෙන් සමාජ සජීවිකරණ වැඩසටහන් හා මූල්‍යාධාර ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන බවත් සමාජ

සජීවීකරණය හරහා කාන්තාවන් හා පවුල්වල ආකල්පමය වෙස්කම් ඇති කිරීමට තම සංවිධානය උත්සාහ කරනු ලබන බවයි. ආකල්ප වෙනස්වීමත් සමඟ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ හැකියාවද වර්ධනය වේ. බොහෝ විට කාන්තාවන්ට බැංකු වලින් ණය ලබා ගැනීමේ දී ගැටළු ඇති වන අතර ඇප තැන්පතු ආදිය ද අවශ්‍ය වේ.

කුඩා කණ්ඩායම් හරහා ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් තම ආයතනය මගින් ලබා දෙන බවත් එකී පහසුකම් භාවිතා කරමින් ආර්ථික හා සමාජීය ලෙස බොහෝ පිරිසක් සවිබල ගැන්වී ඇති බවත් ඇය සඳහන් කරනු ලැබීය.

මෙම ක්‍රමවේදය හරහා කාන්තාවන්ට සමාජයේ හා පවුලේ පිළිගැනීමක් ඇති වන ලෙස අවශ්‍ය පසු බිමද ද සකස් කරනු ලබයි.

## ආරාධිතයන්ගේ අදහස් දැක්වීම්

**භූමි හරේන්ද්‍රන් මහත්මිය** : මෙහිදී ඇය විසින් ගැටළු 03ක් ඉදිරිපත් කරනු ලැබීය.

1. කාන්තාවන් සඳහා විශේෂ දිනයක් අවශ්‍යද?
2. අප වෙනුවෙන් වැඩ කිරීමට සිටින රජයේ නිලධාරීන්ගේ අවශ්‍ය වැඩ ගැනීම අප සිදු කරනවාද?
3. කාන්තාවන් පිළිබඳ වර්ගීකරණයක් තිබේද?

කාන්තා දිනයේ පවත්වන සාකච්ඡාවට වලින් පසුව සියල්ල අමතක වූවාසේ සියල්ලෝම කටයුතු කරන බවක් පෙනෙන්නට ඇතැයි ඇය කියා සිටියාය.

**විජිතා අලස් මහත්මිය,** විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ ජනරාල්

මෙහිදී ඇය දැක්වූයේ වතු ආශ්‍රිත කාන්තාවන්ගේ පෝෂණ මට්ටම ඉතා අඩු මට්ටමක පවතින අතර ඔවුන් බොහෝ විට මන්ද පෝෂණ තත්වයෙන් පෙළෙන බවයි. මේ තත්වය බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල ද දක්නට ලැබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කාන්තාවන්ගේ හා ළමුන්ගේ පෝෂණ මට්ටම වැඩි දියුණු කිරීමේ වැඩපිළිවෙලක් සකස් කරමින් පවතියි.

එසේම ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් ලබා දීමේ වැඩපිළිවෙලක් ද මහ බැංකුව විසින් රාජ්‍ය හා විදේශ ආධාර යටතේ ක්‍රියාත්මක වේ. ග්‍රාමීය කාන්තාවන් ඒ පිළිබඳ දැනුවත් කළ යුතු අතර වෙළඳ පොළ සහාය හා තාක්ෂණික සහාය ද මෙහිදී කාන්තාවන්ට ලබා ගත හැකිය.

**චන්ද්‍රා පද්මිණී මහත්මිය** ශ්‍රී ලංකා තාක්ෂණික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

කාන්තාවන් විවාහ වීමෙන් පසු රැකියාවලින් ඉවත්වන අතර සමහර පිරිසක් ස්වයං රැකියා වල නියුක්ත වේ. බොහෝ පිරිසක් රැකියාවලින් ඉවත් වන්නේ දරුවන් රැක බලා ගැනීම වෙනුවෙන්ය. මන්ද පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ රටතුල ප්‍රතිපත්ති සකස් වී නොමැති බැවින් ඒ සඳහා ප්‍රතිපත්ති සකස් විය යුතුය.

**තේනු රන්කෙත් මහතා**

අධ්‍යාපනය ලබන කාන්තාවන්ගෙන් 70%ක් පමණ රැකියාවල නිරත නොවීම තුල සම්ප්‍රදායන් සංස්කෘතිය හා සදාචාරය පිළිබඳ හිරවීමක් දක්නට ලැබේ. මෙම විලංගු පරම්පරාවෙන් පරම්පරාවට අපි රැගෙන යනවාද යන ගැටළුව පවතියි.

**ශ්‍රියා දයාවංශ මහත්මිය** ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ

දිළිඳුකම පිටුදැකීම සඳහා වන ණය යෝජනා ක්‍රමය වන PAMP මගින් 85%ක් පමණ කාන්තාවන්ට ණය ලබා දීම් සිදු කර ඇත. තවද වෙනත් විශේෂ ආයතන සමඟ එක්ව මහ බැංකුව ව්‍යවස්ථා පුහුණු වැඩසටහන්, මූල්‍ය ගණුදෙනු සිදු කරන ආකාරය මෙන්ම කුසලතා වර්ධන වැඩසටහන් රටපුරාම පවත්වනු ලබයි. රජය විසින් හඳුන්වාදුන් නවතම ණය යෝජනා ක්‍රමය ස්වශක්ති ජාතික ණය යෝජනා ක්‍රමය වන අතර මේ වන විට විශාල වැඩසටහනක් ලෙස එය ක්‍රියාත්මක වේ. ඒ යටතේ ස්වයං රැකියා සඳහා රු.250,000/- ක උපරිමය දක්වා ණය ලබා දෙන අතර වාර්ෂික පොළී අනුපාතය 5.5% වේ.මෙහිදී රු.50,000/-ක උපරිමයකට යටත් ප්‍රදානයක් ආපසු නොගෙවීමේ පදනම මත ලබා දේ. මෙකී ණය ක්‍රමයේදී කාන්තාවන් සඳහා විශේෂ අවධානය යොමු කිරීමට උපදෙස් ලබාදී ඇත. ජනමාධ්‍ය මගින් මේ පිළිබඳව පුළුල් ප්‍රචාරයක්ද ලබාදෙමින් පවතින අතර ඒ සඳහා රජය මිලියන 1000 ක් වෙන් කර ඇත. එය මිලියන 4000 දක්වා වැඩිකිරීමට බලාපොරොත්තු වේ. ලංකාවෙ බැංකු 17 ක් හරහා මෙම මුදල් ලබා ගත හැකිය. මෙම ණය යෝජනා ක්‍රමය පිළිබඳ ප්‍රචාරය ලබා දි ඇති අතර දුරකථන අංකද මගින් උපදෙස් ලබා ගත හැකිය. තවද ඊමේල් මගිනුත් අවශ්‍ය උපදෙස් ලබා ගත හැකිය. වැඩිදුර විස්තර ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මෙන්ම ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ද ලබා ගත හැක.

මෙම ස්වශක්ති ජාතික ණය යෝජනා ක්‍රමය පිළිබඳ අදහස් දැක්වූ **කේ ටී සෝමලතා** මහත්මිය සඳහන් කරනු ලැබුවේ මෙකී ණය යෝජනා ක්‍රමය කෘෂිකාර්මික ප්‍රදේශවලට ගලා නොයාමත් එම පහසුකම් සඳහා ප්‍රවේශවීමේ දී ගැටළු පවතින බවත් ය. දැන්වීම් වල සඳහන් ක්ෂණික දුරකථන අංක වලට සම්බන්ධවීමේ ගැටළු පවතියි. බොහෝ වේලාවක් දුරකථනයේ රැදි සිටීමට සිදුවේ. එසේම විද්‍යුත් ලිපිනයන් හරහා සම්බන්ධ විම ග්‍රාමීය ජනතාවට දුෂ්කර වන්නේ ඒ පිළිබද අවබෝධය නොමැති බැවිනි. ඒ හේතුව නිසා සෑම ගමකටම යා හැකි පරිදි සරල ක්‍රමක් මෙහිදි සකස් විය යුතු බව ඇය දක්වයි.

**චමිලා තුෂාරි මහත්මිය -** ඩා බිඳු එකතුව, නිදහස් වෙළඳ කලාපය

ඇය දැක්වූයේ ඇඟළුම් කේෂ්ත්‍රයේ පසුගිය වකවානුවේ ජී එස් පී බදු සහනය ලබා දී තිබුණ ද එකී ප්‍රතිලාභ කම්කරුවන්ට ගලායාමක් සිදු නොවූ බවයි.

තවද උතුරු නැගෙනහිර ස්ථාපිත ඇගළුම් කර්මාන්ත ශාලාවන්හි කාන්තා සේවිකාවන් විවිධ හිංසනයන් හා කම්කරු නීති උල්ලංඝනයන්ට වැඩිපුර ගොදුරු වීමක් දක්නට ලැබෙන බවද ඇය දක්වයි.

එසෙම කටුනායක , බියගම නිදහස් වෙළඳ කලාප වලට සංක්‍රමණය වී ඇති ද්‍රවිඩ කාන්තා ශ්‍රමිකයන්ට බස් රථ වල නාම පුවරු ද්‍රවිඩ භාෂාවෙන් සඳහන් වී නොමැති බැවින් අපහසුතාවයන්ට පත්වන බව දක්වයි. තවද වැටුප් පත ද්‍රවිඩ භාෂාවෙන් නොමැති අතර බැංකු ගණුදෙනු කටයුතු කර ගැනීම ද භාෂාව නිසා ගැටළුවක් වී ඇති බවත් සඳහන් කරන ඇය එහිදී වැඩිදුරටත් පවසා සිටියේ නිදහස් වෙළඳ කලාප වල ආගමික සිද්ධස්ථාන නොමැති වීම නිසා ද්‍රවිඩ ශ්‍රමිකයන්ට ආගම් ඇදහීමේ දී ගැටළු ඇති වන බවයි.

**චමින්ද මහතා -** ශ්‍රී ලංකා හෙල්ප්ඒජ් ආයතනය

මේ වන විට වැඩිහිටි කාන්තා ජනගහනය සීඝ්‍රයෙන් වැඩිවන අතර බොහෝ කාන්තාවන් මහළු වන විට පවුල් වලින් පිටමන් කරන තත්වයක් උදා වී ඇත. කාන්තාවන් පිළිබඳ ප්‍රතිපත්ති සකස් කරන විට වැඩිහිටි කාන්තාවන් පිළිබඳ අවධානය යොමු කළ යුතු බවට ඔහු වැඩිදුරටත් කරුණු දැක්වීය.

එසේ ඔහු අවධාරණය කරනු ලැබුවේ වැඩිහිටි කාන්තාවන් ස්වයං රැකියාවල නිරතවීමට හැකියාව හා කැමැත්ත තිබුණ ද ප්‍රාග්ධනය සපයා ගැනීමේ දී ඔවුන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දෙනු ලබන බවයි. මන්ද කිසිදු ආයතනයක් වයස අවුරුදු 60ට වැඩි පිරිසට ණය ලබා දීමට අකමැති අතර ඒ පිළිබඳව ද ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු විය යුතු බව දක්වයි.

**අප්සරා වීරසේකර මහත්මිය -** නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

බොහෝ කාන්තාවන්ට දරුවන් රැකබලා ගැනීම වෙනුවෙන් රැකියාවෙන් ඉවත් වීමට සිදු වී ඇත. ශ්‍රීලංකාව තුල පාසල අවසන් වූ පසු දරුවන් බලා ගැනීමේ ක්‍රමවේදයක් දක්නට නොලැබේ. එබැවින් පාසල් අවසන් වූ පසු දරුවන් ආරක්ෂිතව තබා ගැනීම සඳහා ක්‍රමවේදයක් හා ඒ සඳහා ප්‍රතිපත්ති හා නීති සකස් වේ නම් රැකියා කරන කාන්තාවන්ට එය පහසුවක් වනු ඇත. තවද දරුවන් සෑදීම සීමා කිරීමට ද මෙය හේතුවක් ව ඇති බව පෙනී යයි.

වටමේස සාකච්ඡාව අවසානයේ වැඩසටහන මෙහෙය වනු ලැබූ **ආචාර්ය හරිනි අමරසූරිය** දැක්වූයේ කාන්තාවන්ගේ උපායමාර්ගික අවශ්‍යතා පිළිබඳ හා සංස්කෘතිකමය වෙනස්කම් සම්බන්ධව ශ්‍රී ලංකාව පසු බෑමකට ලක්වී ඇති බවයි. ඒ පිළිබඳ අපගේ අනිවාර්ය අවධානය යොමු විය යුතුය බවයි.

මෙහිදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනී **ආචාර්ය දීපිකා උඩගම මහත්මිය** අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ ඉදිරිපත් කරන ලද සියළුම අදහස් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බවයි. එසේම ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ප්‍රතිපත්ති සකස් කිරීමේ දී විවිධත්වයන් පිළිබඳව ද අවධානය යොමු කළ යුතු බව වැඩිදුරටත් දැක්වීය. තවද ඇය දක්වන්නේ අප ලබන සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය තුල විවිධ ගැටුම් ඇති වන බවයි. වෘත්තිකයකු ලෙස නව ලෝකයට පිවිසෙන ගමන් සාම්ප්‍රදායික රාමුව තුල වැඩ කළ යුතු බවට සමාජය විසින් කාන්තාවට අදහසක් ලබා දී ඇත.

අධ්‍යාපන ක්‍රමයේ පවතින ගැටළු සඳහා විසඳුම් සේම ආකල්ප වල සිදු විය යුතු වර්ධනය පිළිබඳව ද සභාපතිතුමිය අවධානය යොමු කරනු ලැබීය. එසේම ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් අදාළ ප්‍රතිපත්ති ජන ජීවිතයට කෙතරම් බද්ධවන ලෙස සම්පාදනය කරනවාද යන්න පිළිබඳව ද අවධානය යොමු කළ යුතු බව දැක්වීය.

එසේම ඇය අවධාරණය කරනු ලැබුවේ ඉඩම් අයිතිය හා ණය ලබා ගැනීම පිළිබඳ ගැටළු ආදී ප්‍රතිපත්තිමය ගැටළු පිළිබඳ කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබීමේ අඩුවක් පවතින බවයි. එසේම මහ බැංකුව හඳුන්වා දී ඇති ණය ලබාදීමේ ක්‍රමවේදය ජනතාවට දුරස්ථ බවත් එය ග්‍රාම නිලධාරීන් මාර්ගයෙන් ජනතාව වෙත යොමු කළ නොහැකි ද යන්න පිළිබඳවත් සභාපතිතුමිය අදහස් දැක්වීය. එසේම ඇය ළමුන් රැකබලා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව දැක්වූ අදහස් ද සාකච්ඡා කළ යුතු බවත් දැක්වූයේ උගත් කාන්තාවන් බොහොමයක් රැකියාවන් නොකිරීමට එය හේතුවක් වී ඇති බැවිනි. එසේම නම්‍යශීලි රාජකාරී වේලාවන් පවත්වාගෙන යාම පිළිබඳව ද අවධානය යොමු වේ නම් සුදුසු බව දැක්වූ සභාපතිතුමිය එනමුත් ශ්‍රී ලංකාවේ ඵලදායිතාවය පිළිබඳ ගැටළු පවතින බැවින් ඒ සම්බන්ධව ද අවධානය යොමු විය යුතු බව සඳහන් කරනු ලැබීය.

ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව පැවැත්වූ වටමේස සාකච්ඡාවේදී මතුවූ මෙම අදහස් සහ යෝජනා ඇතුලත් වාර්තාවක් සකස් කිරීමටත් අවශ්‍ය පියවර ගැනිම සඳහා එකී වාර්ථාව බලධාරීන් වෙත ඉදිරිපත් කිරීමටත් කටයුතු සිදුකරන බවටත් සභාපතිතුමිය සඳහන් කරනු ලැබීය.

ශ්‍රී ලංකාව තුල ප්‍රබල කාන්තා ව්‍යාපාරයක අවශ්‍යතාවය මතුකරලමින් සභාපතිතුමිය සියළුම කථිකයින් සහ සහභාගී වූ පිරිස වෙත ස්තූතිය පිරිනමන ලදියි.

## 2.1. ප්‍රාදේශීය කාර්යාලය

### 2.1.1.අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය

### හැදින්වීම

අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ නිරත වන  කාන්තාවන් ඇගයීම සහ ඔවුන් ධෛර්යයමත් කිරීමත් ඔවුන්ගේ අත්දැකීම්, අභියෝග සහ ජයග්‍රහණයන් හුවමාරු කරගැනීමත් අපේක්ෂා කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ  අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් ජාත්‍යන්තර මානව හිමිකම් දිනය 2017 මාර්තු මස  8 වන දින අනුරාධපුරයේ ක්‍රෙස්ටන් පාර්ක් ශාලාවේදී පවත්වන ලදි.

### සහභාගීවූවන්

ලීලාවතී ගුණවර්ධන මහත්මිය (ගෘහ කර්මාන්තයේ නිරත),ඒ.කුසුමාවතී මහත්මිය (ව්‍යාපාර අංශය),එන්.ජී.කමලාවතී මහත්මිය (ආබාධිත වැඩකරන කාන්තාවන් නියෝජනය කරමින්) හා ජීවන්ති ලියනගේ මහත්මිය (හරිත සංගමය නියෝජනය කිරීම -කෘෂිකාර්මික නිෂ්පාදන ) වට මේස සාකච්ඡාව සහභාගීවී තම අත්දැකීම් බෙදාහදා ගන්නා ලදි. ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්ෂේත්‍රය නියෝජනය කරමින් උතුරු මැද පලාත් සභා ඉඩම් ග්‍රාමීය සංවර්ධන සහ වාරිමාර්ග අමාත්‍ය ගරු  එච්. බී.සේමසිංහ මහතා,පළාත් සැලසුම් සහ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ලේකම් පී.බී දයාරත්න මහතා,කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංයේ සහකාර අධ්‍යක්ෂ ආර්.එස් .පී ගුණවර්ධණ මහතා,දිස්ත්‍රික් වාණිජ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ පී.බී.ඩී.ගුණවර්ධන මහතා ඇතුලු රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ ක්‍රියාකාරීන්  සහ කාන්තා සංවිධානවල සාමාජිකාවන් මෙම වැඩසටහනට සහභාගී වන ලදි.

### අභියෝග හා ගැටළු

- **එන්.ජී.කමලාවතී මහත්මිය**
  ඇය ආබාධිත වැඩ කරන කාන්තාවන් නියෝජනය කරන ඇය තමන් සමග 200 ක් පමණ ආබාධිත කාන්තාවන් සේවය කරන බවත් ඔවුන්ගේ පුහුණු වැඩසටහන් වලදී සංඥා පරිවර්තකයන් නොමැති බවත් දැක්වීය.එබැවින් ඔවුන් වෙත නිසියාකාර නිවැරදි තොරතුරු සන්නිවේදනය නොවන බවත් වැඩිදුරටත් සඳහන් කළාය.බොහෝ පුහුණු වැඩසටහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉහළ මහලේ රැස්වීම් ශාලාවේ පවත්වන බැවින් ආබාධිතයන්ට එහි ඉහළ මහල කරා යාම අපහසු වේ.තවද සමාජ සේවා දෙපාර්තමේන්තුව පමණක් නොව අනෙකුත් සියලු ආයතන, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ආබාධිත කාන්තාවන්ගේ ගැටලු සලකා බැලිය යුතු බව වැඩිදුරටත් දක්වන ඇය සිය නිෂ්පාදන ප්‍රවාහනය කිරීමට පවතින දුෂ්කරතා නිසා ඔවුන්ගේ භාණ්ඩ විකුණා ගැනීම සඳහා වෙළඳපොළක් පවතින්නේ නම් වඩා සුදුසු බවත් රජය විසින් සිය ගම්වලටම පැමිණ මෙම කාන්තාවන්ගේ නිෂ්පාදන ලබා ගන්නේ නම් වඩා සාධනීය වන බවත් රජය මේ කරුණු පිළිබද අවධානය යොමු කළ යුතු බව ත් දක්වයි.

**•හර්ෂනී දයානන්ද මහත්මිය**
ඇය දක්වා සිටියේ ආබාධිත දරුවන් සිටින කාන්තාවන්ට රැකියා සඳහා යාමට නොහැකි බවත් ඔවුන් සිය දරුවන් රැක බලා ගැනීම සඳහා නිවසට වී සිටිය යුතු බවත්ය .එබැවින් නිවසේ සිටම සිදු කළ හැකි ස්වයං රැකියා සඳහා ඔවුන් දිරිමත් කරන්නේ නම් වඩා සාධනීය බව ප්‍රකාශ කළ ඇය මෙම වරප්‍රසාදයන් රජයේ නොවන රැකියා කරන මෙන්ම රාජ්‍ය සේවකයන්ටද සමානව ලබා දිය යුතු බවත් අවධාරණය කළාය. මේ සම්බන්ධව කාන්තාවන් සඳහා වන ප්‍රතිපත්තියක්

උතුරු මැද පළාතේ නොමැති බවත් එමෙන්ම ආබාධිතයන් සඳහා වන පුහුණු වැඩසටහන් වලදී ඔවුන් රැක බලා ගන්නා පුද්ගලයන්ද පුහුණු කළ යුතු බවත් දක්වා සිටියාය.

- **ඒ. කුසුමාවතී මහත්මිය**
  සිය අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ රාජ්‍ය ණය දෙන ආයතන වලින් ණය සහන ලබා ගැනීමේදී විවිධ ගැටලු වලට මුහුණ පෑමට සිදු වෙන බවයි. ඔවුන්ගේ වෙළඳසැල් පවත්වාගෙන යාම පිළිබඳ උපදෙස් ලබා ගැනීමට හෝ කිසිදු යාන්ත්‍රණයක් නොමැති බවත් එබැවින් රජය මගින් මෙවැනි ව්‍යවසායකයන්ට උපදෙස් දීම සඳහා යාන්ත්‍රණයක් ඇති කිරීමටත් ණය සහන පහසුවෙන් ලබා ගැනීමේ වැඩපිළිවෙළක් ඇති කිරීමටත් පියවර ගත යුතු බවයි.

- **ලීලාවතී ගුණවර්ධන මහත්මිය( ස්වයං රැකියාව)**
  ඇය  ප්‍රකාශ කරන ලද්දේ ද ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොළක් නොමැති බවයි. ගැනුම්කරුවන් වැඩිපුර පැමිණෙන ස්ථානවල සිය නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ඔවුන්ට ඉඩකඩක් නොමැති බව ද අලෙවිසැල් මහා පරිමාණයේ ව්‍යාපාරිකයන්ට ලබා දෙන බවත් ක්ෂුද්‍ර ව්‍යවසායකයන්ට නොලැබෙන බවත්; ස්වයං රැකියාවන්හි නිරතවන්නන්ට ගෙවීමට සිදුව ඇති බදු මුදල් ප්‍රමාණය ද ගැටලුසහගත බවත්; ඇය තවදුරටත් ප්‍රකාශ කරන ලදි. එසේම රාජ්‍ය නොවන සංවිධාන විසින් ඔවුන්ට බොහෝ උදව් උපකාර සිදු කරන බව ඇය ප්‍රකාශ කළ අතර ඔවුන්ගේ ස්වයං රැකියා සඳහා යොදා ගනු ලබන උපකරණ අධික මිලකින් යුක්ත වන බවත් පොදු ප්‍රවාහන සේවාවන් සිය නිෂ්පාදන අලෙවි කිරීම සඳහා යොදා ගැනීම ගැටලු රාශියක් මතු කරන බවත් එබැවින් රාජ්‍ය අංශ මේ සඳහා මැදිහත් විය යුතු බවත් දක්වා සිටියාය.

- **ජීවන්ති ලියනගේ මහත්මිය (හරිත සංගමය නියෝජනය කරමින්)**
  ඇය විසින් ප්‍රකාශ කරන ලද්දේ විසිතුරු මල් වගාවේ නිරත වන කාන්තාවන්ට ඔවුන්ගේ නිෂ්පාදන හෙවත් මල් පැළ අලෙවි කිරීම සඳහා වූ වෙළඳ මධ්‍යස්ථානයක් අනුරාධපුර නගරයේ සකස් කරන්නේ නම් සාධනීය බවයි. විසිතුරු මල් පැළ වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ජාතික වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද මෙම ක්ෂේත්‍රයේ නියුතු වූවන් වෙනුවෙන් පැවැත්වීම ඉතා යෝග්‍ය බවද ඇය තවදුරටත් යෝජනා කළාය. වර්තමානයේ දී කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් මල්පැළ, මල් පෝච්චි ආදිය බෙදා හරින නමුත් ඒවා ප්‍රදේශයේ සියලු ම අලෙවිකරුවන්ට ප්‍රමාණවත් නොවන බව ද දක්වා සිටියාය.

- සම්පත් බෙදා හැරීමේදී සහ මූල්‍යමය සහයෝගය ලබා දීමේ වැඩසටහන් සඳහා දේශපාලන මැදිහත්වීම් සිදු වීම.

- ග්‍රාමීය කාන්තාවන්ගේ නිෂ්පාදන හඳුන්වා දීමේ වැඩසටහන් වර්ධනය කළ යුතු වීම.

- වර්තමානයේ පවතින නීති සහ ප්‍රතිපත්ති කාන්තාවන්ට සමීප ඒවා නොවීම.

- රාජ්‍ය ආයතනයන් විසින් දේශපාලනික මැදිහත්වීම් වලින් තොරව නිවැරදි දත්ත මත පදනම්ව ග්‍රාමීය ප්‍රදේශවල පවතින අවශ්‍යතා දියුණු කිරීමටත් සංවර්ධනයටත් පියවර ගත යුතු බව

### රාජ්‍ය නිළධාරීන්ගේ හා සිවිල් සංවිධාන නියෝජිතයන්ගේ අදහස් /ප්‍රතිචාර

- **ගරු අමාත්‍ය එච්. බී සේමසිංහ මහතා**
  සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා සංඥා භාෂා පරිවර්තකයන් ලබා දීමට පොරොන්දු වූ අමාත්‍යවරයා ප්‍රකාශ කර සිටියේ රජය මගින් ගොඩනැගිලි සඳහා ප්‍රවේශ වීමේ පහසුකම් සැපයීමට රෙගුලාසි පනවා ඇති බවත් ඒ පිළිබඳ අදාල පුහුණු වැඩසටහන් සිදු කරන නිලධාරීන්ට උපදෙස් ලබා දිය හැකි බවත්ය.
- පළාත් සැලසුම් සහ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ලේකම්, පී.බී.දයාරත්න මහතා විසින් සිය දෙපාර්තමේන්තුව මගින් අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට මූල්‍යමය ප්‍රතිපාදන වෙන් කරන බව කියා සිටියේය.නමුත් නොවිදිමත් රැකියා ක්ෂේත්‍රය නොසළකාහැර ඇති බවත් දැක්විය.
- පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක එස්.පි.එන්.ගුනවර්ධන මහත්මියට අනුව මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වූ සියලු දෙනාටම පුහුණු වැඩසටහන් පවතින බවත් බතික් කර්මාන්තය සහ අත් යන්ත්‍ර රෙදි කර්මාන්තයද ඊට ඇතුළත් බවත් ඒවා සඳහා සහභාගී වන ලෙසත් දෙපාර්තමේන්තුව විසින් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා සුදුසු ඉඩකඩ ලබා දී තිබෙන බවත්ය.
- අනුරාධපුර වාණිජ මණ්ඩලය විසින් ප්‍රකාශ කළේ ඔවුන් විසින් නොමිලේ පවත්වන පුහුණු වැඩසටහන් මගින් ව්‍යවසායකයන් කෙරෙහි මගපෙන්වීම් සිදු කරන බවත් එක් කණ්ඩායමකට 30 බැගින් වන ලෙස මෙම පුහුණු වැඩසටහන් සඳහා ඉල්ලීම් කළහොත් සහභාගී විය හැකි බවත්ය.

## 2.1.2.බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය

### හැදින්වීම

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය විසින් 2017 මාර්තු 8 වන දින බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී පවත්වන්න යෙදුණි

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ **ආචාර්ය නිශාධිනී පීරිස් මහත්මිය** විසින් මෙම වට මේස සාකච්ඡා මෙහෙයවන ලද අතර පිළිගැනීමේ කතාවත් අනතුරුව ආරාධිත අමුත්තා වූ බදුල්ල දිස්ත්‍රික් ලේකම්වරයාගේ කතාවෙන් පසුව කෙටි වීඩියෝවක්ද ප්‍රදර්ශනය කරන ලදි.

### සහභාගීවූවන්

විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් පැමිණ සිටි කාන්තා නියෝජිතයන් සමගින් බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,ඌව පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක, ඌව පළාත් සභාවේ කාන්තා කටයුතු පිලිබඳ නියෝජ්‍ය ලේකම්, පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, පොලිස් නිලධාරීන් ආදී රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශය නියෝජිතයන් ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමේ වැඩසටහන සඳහා සහභාගී වූහ.

### අභියෝග හා ගැටළු

- මැදගම සිට පැමිණි **මල්ලවාරච්චි මහත්මිය** ප්‍රකාශ කළේ රජය මගින් ලබා දෙන පුහුණු වැඩසටහන් වලින් පසු ඇතැම් පුද්ගලයන්ට දේශපාලන බලපෑම මත ආධාර ලැබුණු බවයි.
- ව්‍යවසායිකාවක් වූ **ටී.මනෝහරී මහත්මිය** විසින් දැක්වූයේ ස්වයං රැකියාවන් ලියාපදිංචි කිරීමේදී යම් යම් දුෂ්කරතා පවතින බවයි. ඇතැම් අවස්ථාවල සිය ව්‍යාපාර වසා දැමීමට පවා තර්ජන එල්ල වූ බවත් කාන්තාවක් ලෙස තමා විවිධ තර්ජනයන්ට හා ගැටළු වලට මුහුන දුන් බවත්ය.
- වතුකර කාන්තාවන් නියෝජනය කරමින් ප්‍රභාත් කුමාර ප්‍රකාශ කළේ වතු කම්කරු ජනතාව අතර පවතින භාෂා ගැටළුව හේතුවෙන් ඔවුන්ට රැස්වීම් ඇමතීමට හෝ සිය අදහස් ප්‍රකාශ කිරීමට නොහැකි තත්වයක් පවතින බවයි.එසේම වතුකර ජනතාව රජයේ නිලධාරීන් කෙරෙහි සෘණාත්මක ආකල්පයක් දරන බවද හේ වැඩිදුරටත් පැවසීය.
- ස්වයං රැකියාවල නිරත වන කාන්තාවන් සඳහා වන ණය පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතා
- රජයේ බැංකුවල අවශ්‍යතා ස්වයං රැකියාවල නියුතු වූවන් සමග නොගැළපීම
- රජය මගින් පුහුණු වැඩසටහන් වලට සහභාගී වන පුද්ගලයන් නොසලකා හරිමින් සහභාගී නොවූ පරිබාහිර පුද්ගලයන්ට උපකරණ ආදිය ලබා දීම
- මූල්‍ය ආධාර හෝ අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදාහැරීමේදී ඒවා දේශපාලනයෙන් තොර වියයුතු වීම.
- ඇතැම් දුෂ්කර ප්‍රදේශ වෙත රජයේ සහයෝගය නොලැබීම
- තාක්ෂණය අතින් ගත් කළ නවීන තාක්ෂණය පිළිබඳ දැනුමෙහි හිගකම
- කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය කෙරෙහි දැනුම අවම වීම, රජයේ සහයෝගය මේ සඳහා නොලැබීම
- අමුද්‍රව්‍ය හා නිෂ්පාදන ප්‍රවාහන ගැටළු
- සුදුසු වෙළෙඳපොලක් නොමැති වීමත්
- වතු කම්කරු කාන්තාවන් වෙත තීරන ගැනීමේ ක්‍රියාවලිය වෙත සහභාගී විමේ අයිතිය පිළිබද ගැටළු
- විදේශ ගෘහ සේවාවන්හි නියුක්ත කාන්තාවන් කෙරෙහි පවතින ගැටළු
- දිවිනැගුම දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන සහන පිළිබඳවද ගැටළු පැවතිණි.

## රාජ්‍ය නිළධාරීන්ගේ හා සිවිල් සංවිධාන නියෝජිතයන්ගේ අදහස් /ප්‍රතිචාර

- දිවිනැගුම දෙපාර්මේන්තුවේ බැංකු කළමනාකාරවරයා ප්‍රකාශ කර සිටියේ 4 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් වශයෙන් පැමිණ ණය සහන ලබා ගැනීමේ අවස්ථාව පවතින බවයි.නමුත් මෙම කණ්ඩායම් ක්‍රියාශීලීව සිය කණ්ඩායම් පවත්වාගෙන යා යුතුය.රජය මගින් මූලික ප්‍රාග්ධනය හා මූල්‍යාධාර ලබා දෙන බවයි.
- රාජ්‍ය නිලධාරීන් මෙවැනි යම් අකටයුත්තක නිරතව ඇත්නම් බලපෑමට ලක් වූ පුද්ලයාට එය සුදුසු අධිකාරියකට පැමිණිලි කල හැකි බවත් එයින් සෑහිමකට පත්නොවන්නේ නම් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කල හැකි බවටත් අදහස් ඉදිරි පත්විය.
- පළාත් පාලන නිලධාරීන් දැක්වූයේ නිරන්තරයෙන්ම රාජ්‍ය නිලධාරීන්ට චෝදනා කල නොහැකි බවත් සම්පත් බෙදා හැරීමේ යාන්ත්‍රණයක් පවතින බවත්ය.
- වතුකරයේ ජනතාව සමග සම්බන්ධ වීමේ දී ඔවුන් සැමවිටම භාෂා පරිවර්තකයන්ගේ සහය ගැනීමට උත්සාහ කරන බව නිළධාරීන් ප්‍රකාශ කරන ලදි.එබැවින ඔවුන් සභාවට ප්‍රකාෂ කළේ අවශ්‍යතාවන් ඇති අය ඔවුන් සමග සම්බන්ධ වන ලෙසයි.

## 2.1.3.මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය

### හැඳින්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය විසින් ජාත්‍යන්තර කාන්තා දිනය 2017 මාර්තු මස 8 වන දින මඩකලපුව නගරසභා ශාලාවේදී පැවැත් වූ අතර ප්‍රාදේශීය සම්බන්ධිකරන නිළධාරි ඒ.සී.ඒ.අසීස් මහතා කාන්තා දිනය වෙනුවෙන් විශේෂ දේශන ඉදිරිපත් කළහ. කාන්තා නියෝජිතයන් විසින් ඔවුන් ගේ අත්දැකීම් සහ අභියෝගයන් හුවමාරු කරගත් වටමේස සාකච්ඡාවේ දී එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන ගැටළු ඉදිරිපත් කළ අතර IWARE කාන්තා සංවිධානයේ සභාපතිනී අනීෂා ෆර්දාස් මහත්මිය විසින් මෙම වටමේස සාකච්ඡාව මෙහෙයවන ලදි.

### සහභාගීවූවන්

අතිරේක දිස්ත්‍රික් ලේකම් ගිරිධරන් මහතා ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ මෙම වැඩසටහනට අවිධිමත් ආර්ථික අංශයේ සේවයේ නියුතු කාන්තාවෝ ද රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ කාන්තා සංවිධානවල සාමාජිකාවන් සහභාගී විය.

### අභියෝග හා ගැටළු

- **එන්.එෆ්.ෆර්වින් මහත්මිය** කජු නිෂ්පාදන ව්‍යාපාරයක යෙදෙන කාන්තාවක් වශයෙන් සිය අදහස් ඉදිරිපත් කළාය.ඇයගේ කර්මාන්තශාලාවේ 80 ක් පමණ වූ සේවක පිරිසක් කටයුතු කරන අතර ඔවුන්ට ප්‍රමාණවත් වැටුපක් නොලැබෙන බවත් දේශීය කජු මිල අධික බවත් එබැවින් ඉන්දියාවෙන් ආනයනය කල යුතු නමුත් ඒහිදී විවිධ දුෂ්කරතාවන්ට මුහුණ පාන්නට සිදුවන බවත් ය.එසේම අදාළ ආයතනයන්ට අනුව මෙම කජු ආනයනය කිරීම සම්බන්ධව දේශපාලඥයෙකුගේ මැදිහත්වීම පවතින බවත් ඔහු එයින් ලාබ ලබන බවත් ප්‍රකාශ විය.එබැවින් මෙම කාන්තාවන් සඳහා අදාල බලපත්‍ර ලබා දී ලාබදායී මිලකට ආනයනය කරවා ගැනීමටත් අවස්ථාව ලබා දිය යුතු බවයි.

- පොදු මතය වූයේ මෙලෙස ආනයනය කිරීමේ දී දේශපාලඥයෙකුගේ සහය අවශ්‍ය වන නමුත් ඉදිරියේදී මෙය නිවැරදි කළ යුතු බවයි.

- **වී .භවානි මහත්මිය** තල් නිෂ්පාදන ව්‍යවසායිකාවක් වශයෙන් අදහස් දැක්විය. ඇයගේ ගමෙහි බොහෝ කාන්තාවන් අර්ධ කාලීන රැකියාවක් වශයෙන් මෙම කර්මාන්තයේ නිරත වන බවත් ඔවුන් විවිධ අභියෝගයන්ට මුහුණ දෙන බවත්ය.වර්ෂා කාලයේදී මෙම නිෂ්පාදනවල හානි වීම වෙළඳාමේ බිඳ වැටීමට හේතු වන බව ඇය දැක්විය. වනහරණය නිසා තල් ශාකය ද විනාශ වීමත් එම නිසා තල් කොළ හිග වීමත් තවත් ගැටලුවකි.විදුලිය ලබාදීමේ ව්‍යාපෘති නිසාද බොහෝ තල් ගස් විනාශ කර දමයි. එසේම ඇතැම් තල් ශාක සුනාමි ව්‍යසනය නිසාද විනාශ වී තිබේ.එසේම අතරමැදි කරුවන් වෙළෙඳාමට සම්බන්ධ වීමද තවත් ගැටලුවකි.

- **වී.ශාන්ති මහත්මිය, ආර්. ඥානේස්වරි මහත්මිය සහ පී. ක්‍රිෂ්ණවේනියි මහත්මිය** මැටි භාණ්ඩ නිෂ්පාදනයෙහි යෙදෙන කාන්තාවන්ය. ඔවුන් ප්‍රකාශ කළේ අමුද්‍රව්‍ය සොයා ගැනීමේ දුෂ්කරතාවයක් පවතින අතර සුදුසු ගුණාත්මක බවින් යුතු අමුද්‍රව්‍ය නොමැති වීම සහ ප්‍රවාහනයේදී වන හානි නිසා නිෂ්පාදනවලට සිදුවන හානි මගින් නිෂ්පාදන විකුණා ගැනීමේ නොහැකියාවක් පවතින බවයි.

- පොදු මතය වූයේ මැටි භාණ්ඩ නිෂ්පාදනයෙහි යෙදෙන පවුල් ඉහළ ලාභයක් ලබන බව රජය අදහස් කරන බැවින් ඔවුන් පිළිබඳ රජය කිසිදු සහන සැලසීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොකරන බවයි. තවද මැටි විකිණීමේ දි තැරැව්කරුවන් ක්‍රියාත්මක විමද ගැටලුවකි.

- **පී.ශර්මිලා මහත්මිය**(හදුන්කූරු නිෂ්පාදනය) විසින් ප්‍රකාශ කරන්නට යෙදුණේ මඩකලපුව ප්‍රදේශයෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීම දුෂ්කර බවයි. කොළඹ නගරයෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීම මිල අධික වේ. නිෂ්පාදන සූදානම් වුවද ඒවා ඇසුරුම් කිරීමේ උපකරණ , මුද්‍රිත නිර්මාණ සඳහා වන වියදම් ආදිය ද ඉතා ඉහළ මිලක් ගන්නා අතර මේ ප්‍ර දේශය තුළ දැඩි තරගකාරීත්වයක්ද පවතින බවයි.

- **ඒ.එෆ් ශිල්භානා** මුහුදු බෙලිකටු මගින් අත්කම් කරන්නීය.ඇය දක්වා සිටියේ අමුද්‍රව්‍ය ගෙන ඒමට යාමේ දි ද විවිධ ප්‍රවාහන දුෂ්කරතා පවතින බවයි. එසේම නිෂ්පාදන සෑදීම ආරම්භ කිරීමේ සිට නිම කළ නිෂ්පාදන වෙළෙඳපොළට නිකුත් කිරීම දක්වාම මෙම ගැටළු ,දුෂ්කරතා පවතින බවයි.

## රාජ්‍ය නිළධාරීන්ගේ හා සිවිල් සංවිධාන නියෝජිතයන්ගේ අදහස් /ප්‍රතිචාර

- නාගරික කොමසාරිස්තුමාට අනුව මැටි ලබා ගැනීමේ අනුමැතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබා ගත යුතු බවත් ඔවුන්ගේ බල ප්‍රදේශයන් තුළ මැටි ලබා ගැනීමෙහි නිරත විය හැකි බවත් ප්‍රකාශ විය.මෙම බලපත්‍රය විධිමත් එකකි.
- දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරීවරයාට අනුව ක්ෂුද්‍ර ව්‍යාපාර ආරම්භයට රු 25000ක මුදලක් ලබා දෙන අතර නිෂ්පාදන කෙරෙහි නෛතික බාධා කිසිත් නොමැති බවත් දක්වන ලදි.එසේම නියමිත අනුමැතිය ලබා ගන්නේ නම් ගැටවක් නොමැති බවද ඔහු දක්වා සිටියේය.
- ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශයේ සහකාර අධ්‍යක්ෂ විසින් ප්‍රකාශ කරන ලද්දේ මුහුදු බෙලිකටු අමුද්‍රව්‍ය පිළිබඳ මෙම ගැටළුව සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත්වෙන බවයි. මෙම පුහුණු වැඩසටහන වැඩකරන කාන්තාවන් ඉලක්ක කරගෙන සිදු කරන බවයි. එසේම අම්පාර දිස්ත්‍රික්කයේ තඹිලුවිල් නම් ග්‍රාමයේ අවශ්‍ය අමුද්‍රව්‍ය පවතින් බවත් ඒවා ලබා ගැනීම සඳහා සහය දැක්විය හැකි බවත්ය.
- තල් සංවර්ධන මණ්ඩලයේ දිස්ත්‍රික් කළමනාකරු විසින් ප්‍රකාශ කරන්නට යෙදුණේ 2500ක පමණ තල් නිෂ්පාදනකරුවන් සිටින බවත් ග්‍රාමීය මට්ටමින් සිය ව්‍යාපාර කිරීමේ අවස්ථාව පවතින බවත්ය.මෙම නිෂ්පාදන විදේශීය සංචාරකයන්ට අලෙවි කිරීමටද හැකියාව පවතී. එබැවින් යම් ගැටලුවක් වේ නම් සිය මණ්ඩලය අමතන ලෙස ය.

## 2.1.4. අම්පාර ප්‍රාදේශීය කාර්යාලය

### හැඳින්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අම්පාර ප්‍රාදේශීය කාර්යාලය මගින් ජාත්‍යන්තර කාන්තා දිනය 2017 මාර්තු මස 8 වන දින ප්‍රාදේශීය කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පවත්වන්නට යෙදුණි. කාන්තා දින සැමරුමෙහි ඉතිහාසය සම්බන්ධ වීඩියෝ පටයක් ප්‍රදර්ශනය කළ අතර තවත් ඉදිරිපත් කිරීමක් හරහා කාන්තා දින තේමාව පිළිබඳ දක්වන ලදි. එසේම තිරසර සංවර්ධන ඉලක්කයන්හි 4 සහ 5 යන ඉලක්කයන්ද මෙම ඉදිරිපත් කිරීම මගින් අවධාරණය කරන ලදි.

### සහභාගීවූවන්

අවිධිමත් ආර්ථික අංශයේ සේවයේ නියුතු කාන්තාවෝ ද රාජ්‍ය නිලධාරීන් නියෝජනය කරමින් කෘෂිකර්මාන්තය පිළිබඳ අධ්‍යක්ෂක, ප්‍රාදේශීය ලේකම්වරු, වෘත්තීය පුහුණු නිලධාරීන්, ග්‍රාමීය සංවර්ධන නිලධාරීවරු, කාන්තා සංවර්ධන නිලධාරී, පොලීසියේ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය, සිවිල් සංවිධාන සාමාජිකයන් රැසක් මෙම වැඩසටහනට සහභාගී විය.

### අභියෝග හා ගැටළු

- අදාළ ක්ෂේත්‍රවල විධිමත් පුහුණුව ලබා දීමේ නොහැකියාව
- කර්මාන්ත සඳහා ආයෝජනය කිරීමේ මූලික ප්‍රාග්ධනයවත් නොමැති වීම සහ ණය පහසුකම් ගැනීමේ පහසුකමක් නොමැති වීම
- නිෂ්පාදන අලෙවි කිරීමේ දී පවතින දුර්වලතා
- සේවක අර්ථ සාධක අරමුදල සහ සේවා නියුක්ති භාර අරමුදල පිළිබඳ අනවබෝධය
- අවුරුදු 40 ට වැඩි කාන්තාවන් අවිධිමත් ආර්ථික අංශයේ රැකියා ලබා ගැනීම සඳහා ලියාපදිංචි වීමේ දුර්වලතාවය
- සුදුසු ජාලගත සන්නිවේදනයක් කාන්තාවන් අතර නොමැති වීම

### රාජ්‍ය නිළධාරීන්ගේ හා සිවිල් සංවිධාන නියෝජිතයන්ගේ අදහස් /ප්‍රතිචාර

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පුහුණු වැඩසටහන් ග්‍රාමීය කාන්තාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වන බව දැක්වීය.
- දිවිනැගුම ව්‍යාපෘතියේ කාන්තා සංවර්ධන අංශයේ නියෝජිත දැක්වූයේ යම් ණය සහන කිහිපයක් රාජ්‍ය බැංකු හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් මගින් ක්‍රියාත්මක කර ඇති බවත් කාන්තා සේවායෝජකයන්ට ඒ සඳහා කිසිදු වෙනසකින් තොරව අයදුම් කළ හැකි බවත්ය.
- දිවිනැගුම සංවර්ධන ව්‍යාපෘතියේ කාන්තා සංවර්ධන නිලධාරීන්ට අනුව ප්‍රවාහන වියදම් සහ අනෙකුත් වියදම් ලබානොදේනම් බොහෝ අවිධිමත් රැකියාවල නිරත වන කාන්තාවන් පුහුණු වැඩසටහන් වලට සහභාගී නොවන බව ප්‍රකාශ කරන ලදි.බොහෝ ස්වයං රැකියාවල නිරත වන කාන්තාවන් කිසිදු සැලසුමකින් තොරව විවිධාකාරයේ ව්‍යාපෘති ආරම්භ කරන බවත් තවදුරටත් පෙන්වා දෙන ලදි.
- ළමා හා කාන්තා කාර්යාංශයේ නිලධාරීන් අවිධිමත් ආර්ථික අංශයේ රැකියා පවත්වාගෙන යන කාන්තාවන් ආරක්ෂා කර ගැනීම පිළිබදව සාකච්ඡා කළේය.
- මෙම අංශයේ කාන්තාවන් සියලු දෙනා ඒකරාශී කරමින් ජාලගත කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතු බවට රජයේ නියෝජිතයෝ අදහස් දැක්වූහ.

## 2.1.5. ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය

### හැඳින්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ත්‍රිකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය විසින් ජාත්‍යන්තර කාන්තා දිනය 2017 මාර්තු මස 8 වන දින ත්‍රිකුණාමලය නගර සභාවේ කුලක්කෝට්ටම් සංස්කෘතික ශාලාවේදී පැවැත්වන ලදි.

### සහභාගීවූවන්

මෙම වැඩසටහන සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් බණ්ඩාරනායක මහතා, නැගෙනහිර පළාතේ ග්‍රාමීය කර්මාන්ත පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්.එම්.නෞෆිස් මහතා, මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක ගරු යෝගේස්වරන් පියතුමා, ත්‍රිකුණාමලය නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥ ලක්ෂ්මිශ්‍රී මහත්මිය, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කාන්තා සංවිධාන ඇතුලු රාජ්‍ය අංශයේ මෙන්ම රාජ්‍ය නොව සංවිධාන වල නියෝජිතයන්ද, සිවිල් සංවිධාන සාමාජිකයන් ද, කාන්තා සංවිධානවල සාමාජිකාවන්ද , මානව හිමිකම් ක්‍රියාධරයන්ද, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ක්ෂුද්‍ර කර්මාන්ත වල නිරත වන්නන්ද සම්බන්ධව විය.

වට මේස සාකච්ඡාව සඳහා සහභාගිවූ කාන්තාවන් තල් ආශ්‍රිත නිෂ්පාදන,අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදනය,අත්කම් නිෂ්පාදන,පොල් තෙල් නිෂ්පාදනය,කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ හම් නිෂ්පාදන හි නිරත වන්නන්විය.

### අභියෝග හා ගැටළු

- ක්ෂුද්‍ර කර්මාන්ත නිෂ්පාදනයන්ට සමාන එහෙත් අඩු මිලකට මහා පරිමාන වෙළෙන්දන් මෙකී නිෂ්පාදන අලෙවි කරන බැවින් භාණ්ඩ නිෂ්පාදනයන් අලෙවි කර ගැනීමේ අපහසුතා.
- නිශ්චිත වෙළෙඳපොළක් නොමැති වීමෙන් භාණ්ඩ අලෙවි කරගැනීම සඳහා දුෂ්කරතා මතුවීම.

### රාජ්‍ය නිළධාරීන්ගේ හා සිවිල් සංවිධාන නියෝජිතයන්ගේ අදහස් /ප්‍රතිචාර

- වාණිජ මණ්ඩලය සඳහන් කරනු ලැබුවේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙළඳ මධස්ථානයක් ආරම්භ කිරීමට මේ වන විට සැලසුම් සකස්කර ඇති බවයි. මේ සඳහා වාණිජ මණ්ඩලය විසින් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් එය සම්මත වුවහොත් මෙවැනි කුඩා පරිමාණ ව්‍යාපාරයන්හි නිරත කාන්තාවන්ට එය හොඳ මූලාශ්‍රයක් බවත් ය.
- කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් බණ්ඩාරනායක මහතා විසින් මෙම කුඩා කර්මාන්ත ව්‍යවසායිකාවන් සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට ප්‍රවේශ වීමේ අවස්ථාව හා ඔවුන්ට ලබා ගත හැකි සේවාවන් පිළිබඳ පැහැදිලි කරන ලදි.
- නැගෙනහිර පළාතේ ග්‍රාමීය කර්මාන්ත පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්.එම්.නෞෆිස් මහතා ද සිය දෙපාර්තමේන්තුව මගින් බලාත්මක කර ඇති ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් පිළිබඳව දක්වන ලදි.ඔහු තවදුරටත් උපදෙස් ලබා දුන්නේ ඕනෑම පුද්ගලයෙකුට සිය දෙපාර්තමේන්තුවට පැමිණ විමසීම් කළ හැකි බවත් සුදුසු පුහුණු පාඨමාලා සඳහා සම්බන්ධ විය හැකි බවත්ය.
- මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක ගරු යෝගේස්වරන් පියතුමා විසින් සහ ත්‍රිකුණාමලය නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥ ලක්ෂ්මිශ්‍රී මහත්මිය විසින් නෛතිත තත්වයන් පිළිබඳ අදහස් පැහැදිලි කරන ලදි.

## 2.1.6. කල්මුණේ ප්‍රාදේශීය කාර්යාලය

### හැඳින්වීම

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කල්මුණේ කාර්යාලය විසින් සංවිධානය කරන ලද වැඩසටහන 2017 මාර්තු මස 8 වන දින ක්‍රිස්ටා-ඉලාම් හිදී පැවැත්වුණි.

මෙහිදී ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිළධාරි සහ ආරාධිත අමුත්තාවූ එස්. සිවප්‍රියා මහත්මිය (අධ්‍යක්ෂක- සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව)දේශන පවත්වන්නට යෙදුණි. AHAM සංවිධානයෙහි නිශාන්තනී මහත්මිය විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලදි.

### සහභාගීවූවන්

ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය, ධීවර, ගෘහස්ථ රැකියා ,ස්වයං රැකියා, මැටි කර්මාන්තය, ගෘහ සේවිකාවන් ආදී වූ නොයෙක් අංශවල සේවය කරන කාන්තාවන් ,කාන්තා සංවිධාන, සිවිල් සමාජ ක්‍රියාකාරිකයන්, ළමා ආරක්ෂණ අධිකාරියේ සම්බන්ධීකාරකවරුන්, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ,පොලිස් නිලධාරීන්, පෙරපාසල් ගුරුවරුන්, සහ පාසල් දරුවන් ඇතුලු 194ක් පමණ පිරිසකගේ සහභාගීත්වයෙන් මෙම වැඩසටහන පවත්වන ලදී.

### අභියෝග හා ගැටළු

- පවුලේ වගකීම දැරීමට වීම සහ සංස්කෘතික බාධාවන් පැවතීම.
- මූල්‍ය ප්‍රාග්ධනය සඳහා සීමිත ප්‍රවේශයක් පැවතීම
- කම්කරු වැටුප් අධික වීම හා මූල්‍යමය ව්‍යාකූලතා
- අමුද්‍රව්‍ය අධික මිලකින් යුතු වීම
- සිය නිෂ්පාදන අලෙවි කිරීමට සුදුසු වෙළෙඳපොළක් නොමැති වීම
- විශාල තරගකාරීත්වයක් පැවතීම,
- අතරමැදියන් විසින් ඔවුන්ගේ මිල ගණන් වලට මෙම භාණ්ඩ ලබා ගැනීම
- නව තාක්ෂණික ක්‍රමවේද සඳහා ප්‍රවේෂ වීමට නොහැකි වීම
- ව්‍යාපාර ජාලයක අවශ්‍යතාවය
- අධික ප්‍රවාහන වියදම්
- ව්‍යාපාර කටයුතු සඳහා ණය පහසුකම් ලබා ගැනීමේදී කොන්දේසි හේතුවෙන් විවිධ දුෂ්කරතාවන්ට මුහුණපාන බව.
- රාජ්‍ය අංශයේ සහය නොලැබීම

### රාජ්‍ය නිළධාරීන්ගේ හා සිවිල් සංවිධාන නියෝජිතයන්ගේ අදහස් /ප්‍රතිචාර

- ජාතික වශයෙන් අවිධිමත් කෙෂ්ත්‍රයේ රැකියාවනහි නිරත වන කාන්තාවන් ශක්තිමත් කිරීම කෙරෙහි අවධාන ය යොමු කල යුතු බව
- ශ්‍රී ලංකාවේ වාණිජ ප්‍රතිපත්තිය සංවේදීව නිර්මාණය විය යුතු අතර එය මෙම අවිධිමත් අංශයේ රැකියාවන්හි යෙදෙන කාන්තාවන්ගේ අවශ්‍යතා පරිදි විය යුතුය.
- අවිධිමත් අංශයේ කාන්තාවන් ධෛර්යයමත් කිරීම සඳහා වූ විවිධ ප්‍රදර්ශන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රාදේශීය , දිස්ත්‍රික් මට්ටමින් මෙන්ම ජාතික මට්ටමින්ද ඇති කල යුතු බව
- වාණිජ කටයුතු පිළිබඳ තීරණ ගැනීමේදී කාන්තාවන් සහභාගී වීම , අමුද්‍රව්‍ය ලබා ගැනීමේදී, ජාතික වෙළද ප්‍රතිපත්තිය පාලනයේදී, වාණිජ ගිවිසුම් සැකසීමේදී, මෙම අංශයේ ගැටළු පිළිබද ඇගයීමේදී කාන්තා සහභාගීත්වය පැවතිය යුතුය.
- ජාතික අයවැයෙන් මේ සඳහා විශේෂ වෙන් කිරීමක් කළ යුතුය.
- අවිධිමත් අංශයේ කාන්තාවන් සමුපකාර සංගම් පිහිටුවිය යුතුය.

## 2.1.7. මාතර ප්‍රාදේශීය කාර්යාලය

### හැඳින්වීම

ජාත්‍යන්තර කාන්තා දිනය මාතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාලය විසින් 2017 මාර්තු මස 14 වන දින සර්වෝදය ශ්‍රවනාගාරයේදී පැවැත්විය. මාතර ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිළධාරි ඩී.එම්.ආර්. දිසානායක මහතා විසින් පිළිගැනීමේ කතාව සහ මෙම වැඩසටහනේ අරමුණු පැහැදිලි කරන ලදි. මාධ්‍යවේදී අමාලි ජයවීර මහත්මිය විසින් වට මේස සාකච්ඡාව මෙහෙයවන ලදි.

### සහභාගීවූවන්

අවිධිමත් ආර්ථික අංශයේ සේවයේ නියුතු කාන්තාවෝ ද ,දිවිනැගුම සහ සමෘද්ධිදෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක, මහ බැංකුවේ නියෝජ්‍ය කලමනාකරු, නීති ආධාර කොමිෂමේ සම්බන්ධිකාරක, මාතර තරුණ සභාවේ කළමනාකාර, මාධ්‍යය, ළමා හා කාන්තා කාර්යාංශයේ පොලිස් නිලධාරී, ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන්. වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වන්නන් ආදී 50 කට ආසන්න සංඛ්‍යාවක් මෙම වැඩසටහන සඳහා සහභාගීවූහ.

### අභියෝග හා ගැටළු

- **වාමිකා දසිල්වා මහත්මිය** ප්‍රකාශ කළේ තමන්ඇදූම් මසා විවිධ රාජ්‍ය ආයතනවලට ලබා දෙනු ලබයි.නමුත් ඔවුන්ට සුදුසු වෙළෙඳපොළක් අවශ්‍යතාවයද ඇය අවධාරණය කර සිටියාය.
- **මංගලා හේවාමද්දුමගේ මහත්මිය** කාන්තා අත්බෑග සහපාසල් බෑග මැසීම සිදු කරන අතර නව තාක්ෂණය පිළිබඳ දැනුම නොමැති බවත් නව යන්ත්‍රසූත්‍ර නොමැති බවත් ප්‍රකාශ කළාය. එම නිසා ඔවුන්ට එන ඇනවුම් නිසි ලෙස ආවරණය කරගත නොහැකි බවද දක්වන්නට යෙදුණි.
- **ඩී.බී.චන්ද්‍රලතා මහත්මිය** ප්‍රකාශ කරන ලද්දේ විසිතුරු මල් වගාවේ නිරත ඇය කෘෂිකර්මාන්ත දෙපාර්තමේනුතුවෙන් ඒ සඳහා අවශය දැනුම ලබා ගත් බවය. නමුත් වගාවන් සඳහා ඉඩමක්

සෙවීමේදීත් ණය පහසුකම් ලබා ගැනීමේදීත් ඇය විවිධ අපහසුතාවන්ට මුහුණ පෑ බවත් පොලිස් අත්අඩංගුවටද පත් වූ බවත් ඇය දක්වා සිටියාය.

- **එච්.එම් ඥානවතී මහත්මිය** කාශ කලේ ඇගලුම් ක්ෂේත්‍රයේ ස්වයං රැකියාවක යෙදෙන කාන්තාවක් ලෙස තමාට මුහුණ පෑමට සිදුවන ගැටලුය. ඇයගේ වයස හේතුවෙන් කිසිදු බැංකුවකින් ණය පහසුකම් ලබා ගත නොහැකි වීම විශාල ගැටලුවක් බවද ඇය දක්වා සිටියාය.

### රාජ්‍ය නිළධාරීන්ගේ හා සිවිල් සංවිධාන නියෝජිතයන්ගේ අදහස් /ප්‍රතිචාර

- නීති ආධාර කොමිෂන් සභාවේ රජිකා මහත්මිය විසින් මෙම කාන්තාවන් පසසමින් නීතිය පිළිබද පැහැදිලි කළාය. කාන්තාවට ණය, නීතිය සහ රක්ෂණය යන අවස්ථා සම්බන්ධව දැනුම තිබිය යුතු බව දක්වා සිටින ලදි.
- මහ බැංකුවේ බැංකු කලමනාකරු එම්.පී අරුණ මහතා ප්‍රකාශ කලේ බැංකු සමග සාකච්ඡා කර ක්ෂුද්‍ර ණය පහසුකම් ලබා ගත හැකි බවයි.
- දිවි නැගුම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රකාශ කරන ලද්දේ අවුරුදු 18-19 ට ඉහල ව්‍යවසායකයන් වෙත සමෘද්ධි බැංකු ණය සහන ලබා දෙන බවයි.නමුත් බොහෝ ව්‍යවසායකයින් නවින තාක්ෂණය පිළිබද හෝ තම ව්‍යාපාරය පිළිබද දැනුම අළුත් කරනොගනියි.ඔවුනට තාක්ෂණික දැනුම ලබාදෙන ගමන්ම ආකල්ප ද වෙනස් කළ යුතුය.
- මාතර තරුණසේවා සභාවේ ඩබ්.ජේ.විදානපතිරන ප්‍රකාශ කළේ ජාතික තරුන සේවා සභාව හරහා තරුණයන්ට මෙහි සාමාජිකත්වය ගත හැකි බවයි. මෙම සංගමය සතුව ණය පහසුකම්ද පවතී.
- කේ.ඩී.එල් මාධවී විසින් දක්වා සිටියේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් කාන්තාවන් සදහා ණය පහසුකම් සකස් කර සෙන බවයි. එසේම මෙමගින් පුහුණු වැඩසටහන් ද පවත්වයි.
- එස්.ඒ.සි. දිල්හානි (දික්වැල්ල පොලිස් ස්ථානය) අවිධිමත් ක්‍රියාකාරකම්, ණය ලබාගැනීම්.පදික වේදිකාවේ භාණ්ඩ අලෙවිය ආදී වශයෙන් නොයෙක් පැමිණිලි සිය පොලිස් ස්ථාන වෙත ලැබෙන බවයි.

## 2.1.8.යාපනය ප්‍රාදේශීය කාර්යාලය

### හැදින්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ යාපනය ප්‍රාදේශීය කාර්යාලය මගින් සංවිධානය කරන ලද ජගත් කාන්තා දින සැමරුම 2017 මාර්තු 8 වන දින යාපනය තොඩර්පාම් ශාලාවේදී පැවැත්වුණි.

මෙහිදී තෝරාගත් විවිධ වර්ගයේ කුඩා පරිමාණයේ ව්‍යවසායන්ගේ නිරත; එනම් ඇඳුම් මැසීම, කර්මාන්තය, වියළි ආහාර නිෂ්පාදන, වියළි මුහුදු ආහාර නිෂ්පාදන, සම් නිෂ්පාදන, ඉවතලන ද්‍රව්‍යවලින් කොට්ටඋර සහ පාපිසි නිර්මාණය කිරීම, තල් නිෂ්පාදන,සත්ව පාලනය ආදී ව්‍යවසායන්ගේ නිරත වන කාන්තාවන්ට මෙහිදී ආරාධනා කරන ලද අතර ඔවුහු සිය අත්දැකීම්, අභියෝග, ගැටලු සහ ඉලක්කයන් ජයගත් ආකාරය හුවමාරු කරගත්හ.

### සහභාගීවූවන්

වට මේස සාකච්ඡාව සදහා ශර්මිලා චන්ද්‍රදාසන් මෙනවිය - තඹ නිෂ්පාදන, ඇන්තනී බේනාශා සුබාජිනි මහත්මිය- ආහාර සදහා සතුන් ඇති කරන,ජෛත්‍යරාජ් ශායිලා මහත්මිය - වියළි මුහුදු ආහාර නිෂ්පාදනය,ජෙගනාදන් සත්යේස්වරී මහත්මිය - සතුන් ඇති කිරීම, චාර්ල්ස් විජයරත්නම් තාවච්චරි

මහත්මිය - සම් නිෂ්පාදන, ඉවතලන ද්‍රව්‍ය වලින් කොට්ට උර ආදිය සැකසීම,ජෙයසෙල්වම් රාජකලා මහත්මිය - වියළි ආහාර නිෂ්පාදන,කේතීස්වරන් සුදර්ශනී මහත්මිය - ආහාර නිෂ්පාදනය,තර්මරත්නම් මන්කයියට්කරසි මහත්මිය- ඇදුම් මැසීම සහ සතුන් ඇති කිරීම යන අය සහභාගී වූ අතර යාපනය අතිරේක දිසාපති එස්.තේවේන්ද්‍රම් මහත්මිය, නියෝජ්‍ය කම්කරු කොමසාරිස් එම්.ජෙගදීස්වරන් මහතා, තල් සංවර්ධන මණ්ඩලයේ සම්බන්ධීකාරක කළමනාකරු කේ. ගෝපාලක්‍රිෂ්ණන් මහතා, යාපනය විශ්වවිද්‍යාලයේ නීති අංශයේ ආචාර්යය නීතිඥ කෝසලායි මහත්මිය යනාදීන් ඇතුලුව රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් මෙන්ම කාන්තා සංවිධානවල නායකත්වය දරන කාන්තාවන්ද 90 කට ආසන්න පිරිසක් මෙම සාකච්ඡාව සඳහා සහභාගී වූහ.

## අභියෝග හා ගැටළු

- මෙම කාන්තාවන් අතරින් ඇතැම් කාන්තාවන් වැන්දඹු කාන්තාවන් වන අතර ඔවුන් පවුලේ ගෘහමූලිකත්වය දරයි. ඇතැම් කාන්තාවන් ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් මිය ගිය අවස්ථාවලදී සියදිවි නසා ගැනීමට උත්සාහ කළ අවස්ථාද පැවති බව ප්‍රකාශ විය.
- මෙවැනි තත්වයක් යටතේ ඔවුන් කිසිම අවස්ථාවක සාර්ථක වේ යැයි නොසිතූ බවත් ඔවුන් දන්නා රැකියාව කුමක් වුවත් එය සිදු කිරීමෙන් ඔවුන් ස්වෝත්සාහයෙන් ජීවන තත්වය නගා සිටුවා ගත්තද තවමත් එය අභියෝගයක් වී ඇත.
- කිසිවකුගේ උපකාරයක් නොමැතිව සිය වැඩකටයුතු සිදු කරගැනීමට සිදු වීමත්, දේශීය නිෂ්පාදන ගැනීමට ගැනුම්කරුවන් උනන්දු නොවීමත් නිසා නිෂ්පාදන වෙළෙඳපොළට ගෙන යාමේදී දුෂ්කරතා වලට මුහුණ දීම.

### රාජ්‍ය නිළධාරීන්ගේ හා සිවිල් සංවිධාන නියෝජිතයන්ගේ අදහස් /ප්‍රතිචාර

- සිවිල් සංවිධාන මෙම කාන්තාවන්ට අවස්ථාවන් සහ මූල්‍ය ආධාර ලබා දිය හැකි බවද දැක් විය.

## 2.1.9. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය

### හැඳින්වීම

ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මහනුවර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2017 මාර්තු 8 වන දින මහනුවර කැප්පෙටිපොළ ශ්‍රවණාගාරයේදී පවත්වන්න යෙදුණි.

### සහභාගීවූවන්

අවිධිමත් ආර්ථික අංශයේ සේවයේ නියුතු කාන්තාවෝ ද රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ කාන්තා සංවිධානවල සාමාජිකාවන් සහභාගී විය.

### අභියෝග හා ගැටළු

- පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය ඉහළ දැමිය යුතු බවත් කාන්තාවක් තවත් කාන්තාවකට ඡන්දය ප්‍රකාශ නොකිරීමේ සෘණාත්මක ආකල්පය පැවතීම.

- වතු ජනතාව සඳහා යටිතල පහසුකම් අවම වීම හා ලිංගික හිංසනය පැවතීම.

- ආබාධිත කාන්තාවන්, යුද්ධයෙන් පීඩාවට ලක් වූ කාන්තාවන් සහ වැන්දඹුභාවයට පත් කාන්තාවන් ශක්තිමත් කළ යුතු විම.

- අවුරුදු 16-18 අතර වූ ගැහැණු දරුවන් සම්බන්ධ නීති තත්වය ද වෙනස් විය යුතු විම.

## රාජ්‍ය නිළධාරීන්ගේ හා සිවිල් සංවිධාන නියෝජිතයන්ගේ අදහස් /ප්‍රතිචාර

- රජයේ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ සංගමයේ සභාපතිනි දේවිකා කොඩිතුවක්කු ප්‍රකාශ කළේ කාන්තාවන් කෙරෙහි කිසිදු ආකාරයක වෙනස්කොට සැලකීමක් නොතිබිය යුතු බවයි.
- මහනුවර ප්‍රදේශීය ලේකම් ප්‍රකාශ කර සිටියේ ස්ත්‍රීපුරුෂ භාවය, සංස්කෘතිය, ආදී සාධක කාන්තාවන් ඉදිරියට ඒම වළක්වන බවයි.
- නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරිය ප්‍රකාශ කර සිටියේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් බලාත්මක කළ යුතු බවයි.
- කාන්තාවට ගරුත්වය සහ නිදහස සහිත ජීවිතයක් ලැබිය යුතු බවත් ඔවුන් ආරක්ෂා කිරීම සඳහා වගකීමක් සියලු දෙනාටම ඇත.

## 3.0.අවිධිමත් රැකියා ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ පොදු ගැටළු /අභියෝග - පොදු නිරීක්ෂණ හා නිගමන

2017 ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල විසින් සංවිධානය කරනු ලැබූ වටමේස සාකච්ඡාවේදී අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රහි නියුතු කාන්තාවන් විසින් තමන් මුහුණ දෙන ගැටළු, අභියෝග හා ලැබූ ජයග්‍රහණයන් පිළිබඳ අදහස් දක්වනු ලැබීය.එහිදී දැක්වූ සියලු අදහස් සමාලෝචනය කිරීමෙන් පසු පහත නිගමනයන්ට එළඹිය හැකි බව නිරීක්ෂණය වේ.

අ) සෑම පලාතකම සෑම ක්ෂේත්‍රයකම කාන්තාවන් මුහුණ දෙන ප්‍රබල ගැටළුවක් ලෙස නිසි වෙළඳ පොළක් නොමැති වීම දැකිය හැකිය. මෙහිදී කාන්තාවන් වීම නිසාම වෙළඳ පොළ අවස්ථා අවම වීමත් මිල ගණන් සඳහා කේවල් කිරීමේ අපහසුවත් අවධාරණය කරනු ලැබීය.තවද අවිධිමත් ආර්ථික ක්ෂේත්‍ර තුල නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හා සමාන භාණ්ඩ ආනයනය කිරිම හේතුවෙන් දේශිය වෙළඳ පොළ පවත්වා ගෙන යාම අපහසු වී ඇත.

ආ) කාන්තාවන්ට බැංකු හා වෙනත් මූල්‍ය ආයතන මගින් ණය පහසුකම් ලබා ගැනීමට ඇති ගැටළු ද නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට බාධාවක් වී ඇත. රජය විසින් බොහෝ ණය යෝජනාක්‍රම අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයට හඳුන්වා දුන්නද ඒවා පහසුවෙන් කාන්තාවන්ට ළඟා විය හැකි ලෙස සකස් නොවීම නිසා නිසි ප්‍රතිලාභ කාන්තාවන්ට අහිමිව යයි. ඒවායින් පනවන කොන්දේසි කාන්තාවන්ගේ ජීවන යථාර්ථයට නොගැලපෙන බවක් දක්නට ලැබේ. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඇප තැන්පතුලෙස ඉඩම් හිමිකම් ලේඛණ බැංකු විසින් සලකා බලන අතර බොහෝවිට එම ලේඛණ සැමියාගේ නමින් වීම මත කාන්තාව වෙත ණය නිකුත් නොකිරිම සිදුවන බව පෙනි යයි. වෙනත් අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රහි බෙහෝ කාන්තාවන්ට ද ණය පහසුකම් ලබා ගැනීමේ දී ඇප ලෙස තැන්පත් කිරීමට ඇගේ නමට දේපළ නොමැති වීමගැටළුවක් වී ඇත. මෙහිදී වැඩිහිටි කාන්තාවන්ට වැඩිහිටිභාවය හේතුවෙන් ණය පහසුකම් ලබා ගැනීම බාධාවක් වී ඇති අතර තවත් එසේම ලබාගන්නා ණය නිසි කළමණාකරණයකින් යුතුව භාවිතා කිරිම පිළිබඳ නොදැනුවත් භාවයද කාන්තාවන් අතර දක්නට ලැබේ. තවද බොහෝ අවිධිමත් ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ග්‍රාමීයව ක්‍රියාත්මක වෙමින් කාන්තාවන් දැඩි ණය උගුලක සිරකරන බවද පෙනි ය යි.

ඇ) ග්‍රාමීය ප්‍රදේශවලට නිසි පරිදි සම්පත් බෙදී නොයාම ද කාන්තා ව්‍යවසායිකාවන් මුහුණ දෙන ගැටළුවකි. එසේම මෙම ක්‍රියාවලියට සිදුවන දේශපාලන ඇඟිලි ගැසීම් හේතුවෙන් අත්‍යවශ්‍ය පුද්ගලයින්ට සම්පත් හා සහනාධාර නොලැබී යාම දැඩි බාධාවක් බව පෙනී යයි.

ඈ) ප්‍රාදේශීය කාර්යාල බොහොමයක දී දැක්වූ අදහස් වූයේ එම කාන්තාවන් ස්වයං රැකියා කරන ක්ෂේත්‍රයට අදාළ අමුද්‍රව්‍ය ලබා ගැනීම සඳහා අධික වියදමක් දැරීමට සිදු විමයි. එසේම අමුද්‍රව්‍ය ප්‍රවාහන වියදම අධික වීම ද අමුද්‍රව්‍ය හිගයද කාන්තාවන් මුහුණ දෙන ගැටළු වකි.

ඉ) කාන්තාවන් අතර පවතින තවත් ගැටළුවක් ලෙස ඉස්මතු වූයේ මන්දපෝෂණ තත්වයයි. මෙය දැඩිව ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රදේශ, වතුකරයේ මෙන්ම ආයෝජන ප්‍රවර්ධන කලාප වල ද දක්නට ලැබෙන බවට ප්‍රකාශ විය.

ඊ) බොහෝ විට පහසුකම් සැපයිය යුතු රජයේ බලධාරීන් නොවිදිමත් රැකියාහී නියුතු කාන්තාවන් නොසලකා හැරීම හා අවශ්‍ය පහසුකම් සපයා නොදීම ද අවධාරණයට ලක් විය යුතුබව පෙනියයි . ගෘහමූලිකයා ලෙස රජයේ නිලධාරින් විසින් ස්වාමිපුරුෂයාව සැලකීම හේතුවෙන් සහනාධාර ස්වාමිපුරුෂයාට ලබා දීමෙන් අවභාවිතා විම් සිදුවිම ද පෙනි යන ලදි යි.

උ) මෙම වටමේස සාකච්ඡාවන්හිදී අවධානයට යොමු වූ තවත් අදහසක් වූයේ නවීන තාක්ෂණය භාවිතය පිළිබඳව පවතින ගැටළුය. නිෂ්පාදන ක්ෂේත්‍රයේ වර්ධනය ඇති කර ගැනීමට නිෂ්පාදන ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමේ දී නවීන තාක්ෂණික දැනුම භාවිතා නොකිරීමත් ඒ පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් කාන්තාවන්ට නොවීමත් හඳුනාගත හැකිවිය.

ඌ) මෙම සෑම කාන්තාවකටම පොදු ගැටලුවක් ලෙස පෙනී යන්නේ කාන්තාවන් පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දි ඔවුන් නොසළකා හැරීම සහ ඒ සඳහා සම්බන්ධ වීමට අවස්ථාවන් නොමැති වීමයි.

එ) විශේෂ ක්ෂේත්‍ර හි පවතින ගැටලු පිළිබඳ විමසන විට ,වතු කරයේ භාෂා ගැටළු මෙන්ම ජීවන මට්ටමේ ද ගැටළු ඇති අතර වතුකරයේ මෙන්ම නිදහස් වෙළද කලාපයන්හිද කාන්තාවන් ලිංගික අපයෝජනයන්ට හා නොසලකා හැරීම් වලට ලක්වීම සුලභ බව පෙනී යයි.

ඒ) තවද ආබාධිත කාන්තාවන් ආර්ථික කටයුතු වල නිරත වන විට සංනිවේදන ගැටළු,පහසුකම් හිමි නොවීම සහ ප්‍රවාහන ගැටළුවලට ද මුහුණ දෙන බව පෙනී යයි.

ඔ) ඉඩම් සංවර්ධන ආඥා පනත වැනි කාන්තාවන් නොසලකා හරිනු ලබන පෞද්ගලික නීතීන් හි සංශෝධන මෙන්ම වතු සේවකයින්ට අදාළ නිති තවමත් සංශෝධනය නොවීමත් ගැටලු සහගතය.

ඕ) යුද්ධය යෙන් පිඩාවිදි උතුරේ මෙන්ම දකුණේද කාන්තාව නොසළකා හැරීමට සමාජයට මෙන්ම රජයටද නොහැකි අතර ඔවුන් බලගැන්වීමේ අවශ්‍යතාව පෙනිය යි.

ක) මෙම වැඩසටහන තුළ දී මතුවූ විධිමත් මෙන්ම අවිධිමත් ක්ෂේත්‍ර හි නියුතු කාන්තාවන් මුහුණ දෙන ගැටලුවක් ලෙස අවධාරණය කල හැක්කේ ආර්ථික කටයුතු වල නිරතවන විට දරුවන් රැකබලා ගැනීමේ දි මතුවන ගැටලුවයි. පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳ රටතුල ප්‍රතිපත්ති සකස් වී නොමැති වීමත් සහ පාසල් අවසන් වූ පසු දරුවන් ආරක්ෂිතව තබා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් විය යුතුය.

වටමේස සාකච්ඡාවට සහභාගීවූ කාන්තාවන් දැක්වූ සමස්ත අදහස් විමසන විට පෙනී යන්නේ සෑම පළාතකම සෑම ක්ෂේත්‍රයකම කාන්තාවන් මුහුණ දෙන පහත පොදු ගැටළු හා අභියෝග පවතින බවයි:

අ) ග්‍රාමීය හා ස්වයං රැකියා ක්ෂේත්‍ර සඳහා රජය විසින් ලබා දෙන සම්පත් බෙදීයාමේ විෂමතා හා ඒ සඳහා පවතින දේශපාලන මැදිහත්වීම

ආ) නිෂ්පාදන අලෙවි කිරීමේ දී නිශ්චිත හා විධිමත් වෙළඳපොලක් නොමැති වීම

ඇ) අමුද්‍රව්‍ය මිල අධික වීම හා අමුද්‍රව්‍ය හිඟය.

ඇ) අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රය සඳහා ණය ලබා ගැනීමේ පවතින දුෂ්කරතා,රජය හඳුන්වා දෙන සහන ණය පහසුකම් වෙත ප්‍රවේශ වීමේ පවතින අපහසුතාවයන්, ලබා ගන්නා ණය කළමනාකරණය පිළිබඳ පවතින නොදැනුවත්භාවය හා ක්ෂුද්‍ර ණය ලබාදෙන ආයතන නිසි නියාමනය කිරීමේ රජයේ විධිමත් වැඩපිළිවෙලක් නොතිබීම

ඉ) අමුද්‍රව්‍ය හා නිෂ්පාදන ප්‍රවාහනයේදී අධික වියදම් දැරීමට සිදුවීම

ඊ) අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ ජාලගත වීමේ හෝ සංවිධාන ශක්තිය අවම වශයෙන් පැවතීම

උදා:- සමුපකාර සංගම් නොපිහිටුවීම

උ) නවීන තාක්ෂණය භාවිතය පිළිබඳව පවතින ඌන දැනුම, නිපුණතා වර්ධනය සඳහා දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් හිඟ වීම හා මෙම කාන්තාවන් ධෛර්යමත් කිරීම සඳහා ප්‍රාදේශිය ,දිස්ත්‍රික් හෝ ජාතික තලයේ ප්‍රදර්ශනවල හිඟ කම.

ඌ) වානිජ කටයුතු පිළිබඳ තීරණ ගැනීමේ දී අමුද්‍රව්‍ය ලබා ගැනීමේ දී, ජාතික වෙළඳ ප්‍රතිපත්ති පාලනයේ දී, වානිජ ගිවිසුම් සැකසීමේ දී හා මෙම අංශයන්හි ගැටළු පිළිබඳ විමසීමේදී කාන්තා සහභාගිත්වය අවම මට්ටමක පැවතීම

එ) ජාතික අයවැයෙන් අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රය සඳහා විධිමත් නිශ්චිත වෙන් කිරීම් සිදු නොවීම

ඒ) ශ්‍රී ලංකාවේ වානිජ ප්‍රතිපත්ති අවිධිමත් ආර්ථික අංශයේ කාන්තාවන්ගේ අවශ්‍යතාවයන්ට අනුරූප වන පරිදි නිර්මාණය නොවීම

ඔ) ජාතික වශයෙන් අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු නොවීම

ඕ) මව ආර්ථික කටයුතු වල නියුතු වන විට දරුවන් රැකබලා ගැනීමේ ප්‍රමාණවත් හා ක්‍රමවත් දිවා සුරැකුම් මධ්‍යස්ථාන නොවීම

ක) මිල අඩු විදේශ ආනයන හේතුවෙන් අවිධිමත් ක්ෂේත්‍රයේ නිෂ්පාදන සඳහා දේශීය වෙළඳපොල අඩුවෙමින් පැවතීම හා නිෂ්පාදන අලෙවි කර ගැනීමේ දුෂ්කරතා

ග) ප්‍රතිපත්ති සම්පාදනයේදී ග්‍රාමීය හෝ අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ කාන්තා දායකත්වය නොසලකා හැරීම

ජ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ පවතින කාන්තාවන්ට වෙනස්කම් කරනු ලබන ප්‍රතිපාදන

ට) ගෘහමූලිකයා ලෙස රජයේ නිලධාරින් විසින් ස්වාමිපුරුෂයාව සැලකීම හේතුවෙන් ගොවිතැන් කිරීමේ දී හා සහනාධාර ලබා ගැනීමේ දී කෘෂිකාර්මික කාන්තාවන්ගේ සහභාගිත්වය නොසලකා හැරීම

ඩ) වැවිලි ක්ෂේත්‍රයේ කාන්තාවන්ගේ මූලික වැටුප් හා වේතන ගෙවීමේදී අසමාන ලෙස සැලකීම

ණ) වැවිලි ක්ෂේත්‍රයට අදාළ නීති රීති ක්‍රියාත්මක නොවීම

ත) කම්කරු දෙපාර්තමේන්තුව වැවිලි ක්ෂේත්‍රය පිළිබඳ නිසි අවධානය යොමු නොකිරීම

ද) රජයේ නිලධාරීන් විසින් වතු සේවකයන්ගේ ජීවන තත්වයන් පිළිබඳ සංවේදී නොවීම

න) සේවක වෘත්තීය සමිති පක්ෂ දේශපාලනයට අනුගතවීම

ප) වතු ක්ෂේත්‍රයට අදාළව සේවකයන්ට හිතකර නව නීති සකස් නොවීම

අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයන්හි නිරත වෙමින් රටේ ආර්ථිකයට ඔවුන් දක්වන දායකත්වය තවදුරටත් වර්ධනය කරලීමට මෙම ගැටළු විසඳීමට අදාළ රජයේ බලධාරීන් වෙත නිර්දේශ ලබා දීම මෙම වැඩසටහනෙන් බලාපොරොත්තු වන බැවින් එකී නිර්දේශ පිළිබඳ අවධානය යොමු කරලීම සුදුසුවේ.

## 4.0 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ලබාදෙන නිර්දේශ

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභ පනතේ 10 හා 11 වගන්ති ප්‍රකාරව හිමි බලතල යටතේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත සදහන් මූලික නිර්දේශ නිකුත් කරනු ලබයි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අධික්ෂණය කරන අතර මෙකී නිර්දේශ උල්ලංඝනය කිරීම සිදු වන්නේ නම් ඒ පිළිබදව පැමිණිලි කිරීමට ද අදාළ උල්ලංඝනයන්ට මුහුණ දුන් පුද්ගලයින්ට හැකියාවක් ඇති අතර එකී උල්ලංඝනයන් පිළිබදව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට කොමිෂන් සභා පනතේ 14 වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් එහි මෙහෙය වීමෙන් පැමිණිලි විමර්ශනය කිරීමේ හැකියාව ද පවතී.

පහත සදහන් නිර්දේශයන් කාන්තාවන්ට එරෙහිව සිදුවන වෙනස්කම් සැළකිල්ලට ගනිමින් ඒවා තුරන් කිරීම සදහා ලබාදෙන නිර්දේශයන් වේ. මෙම නිර්දේශ ලබාදීම සදහා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2)[1] ව්‍යවස්ථාවත් කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ අන්තර්ජාතික සම්මුතියේ පළමු වැනි වගන්තියත්[2] පාදක කරගන්නා ලදී.

1. කාන්තාවන් සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී හා ප්‍රතිපත්තීන් සකස් කිරීමේ දී නියමිත ක්ෂේත්‍ර නියෝජනය කරන කාන්තාවන් ඒ සදහා සැම විටම සහභාගී කරවා ගැනීමට කටයුතු සිදු කිරීම. මෙකී කාර්ය අදාළ රාජ්‍ය ආයතන මගින් සිදු වන්නේ ද යන්න අධීක්ෂණය ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කළ යුතුය. පලාත් රාජ්‍ය ආයතන මගින් මෙම නිර්දේශය ක්‍රියාත්මක වන්නේද යන්න පලාත් කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කළ යුතුය.

2. කෘෂිකාර්මික ප්‍රදේශ වලට හා අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයන්හි නියුතු කාන්තාවන්ට ණය ලබාදීමේ දී වෙනස්කම් වලින් තොරව ණය ලබාදීම සදහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම. එහිදී කාන්තාවන්ට වෙනස්කම් නොකරන ජාතික ණය ප්‍රතිපත්තියක් සකස් කිරීම,ණය ලබාදීමේ ජාතික ප්‍රතිපත්තියක් කාන්තා නියෝජනය සහිතව සකස් කිරීම, ණය නිසි කළමණාකරණය පිළිබද දැනුවත් භාවයක් ඇති කිරීම හා ක්ෂුද්‍ර ණය ලබා දීමේ යෝජනා ක්‍රම හා එම ආයතන නියාමනය කිරීම, ඒ සදහා ප්‍රතිපත්ති සකස් කිරීම ශ්‍රී ලංකා මහා බැංකුව හා ණය ලබා දෙන රජයේ සහ පෞද්ගලික බැංකු ඇතුළු මූල්‍ය ආයතන කටයුතු කළ යුතුයි.

3. අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ මෙන්ම විධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ ද නියුතු කාන්තාවන්ගේ දරුවන් රැකබලා ගැනීම සදහා විධිමත් දිවා සුරකුම් මධ්‍යස්ථාන ජාලයක් පිහිටුවීමේ ක්‍රමවේදයන් ඇති කිරීම හා ඒවා ස්ථාපිත කිරීම ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය,සමාජ සවිබලගැන්වීම්,සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය හා සියලුම පලාත් අමාත්‍යාංශ විසින් පියවර ගත යුතුය.

---

[1] කිසිදු පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාවද කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර හෝ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජනය නොවිය යුත්තේය.

[2] තත් සම්මුතියේ ඇතුළත් පරමාර්ථ විෂයෙහි කාන්තාවන්ට එරෙහි වෙනස්කම් යන පදයෙහි අර්ථය ස්වකීය විවාහකත්වය නොසළකා, පුමිතිරි සමානාත්මතාවය පිළිබද පදනමක් මත, දේශපාලන, ආර්ථික, සමාජීය, සංස්කෘතික, සිවිල් හෝ වෙනත් ඕනෑම ක්ෂේත්‍රයක මානව අයිතිවාසිකම් හා මූලික නිදහස ස්ත්‍රීන් විසින් පිළිගැනීම භුක්ති විඳීම හෝ භාවිතයේ බාධා කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම හෝ ප්‍රතිඵලය හෝ පරමාර්ථය කොටගත් ස්ත්‍රී පුරුෂ භේදය මත පදනම් වූ කවරාකාරයක හෝ විභේදනය, නිෂේධනය හෝ සීමා කිරීම හෝ වන්නේය.

4. අවිධිමත් ආර්ථික ක්ෂේත්‍ර පිළිබඳ කාන්තාවන්ගේ නිපුණතා වර්ධනය සඳහා ක්‍රමානුකූල පුහුණු කිරීම් ක්‍රියාවලියක් හා නවීන තාක්ෂණික දැනුම ලබා දීමට කුසලතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, ග්‍රාමිය ආර්ථික කටයුතු අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය හා සියලුම පලාත් සභාහී ග්‍රාමීය සංවර්ධන,තාක්ෂණික,ආර්ථික සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශ විසින් පියවර ගත යුතුය. මෙහිදී අලෙවිකරණය, වෙළඳ ප්‍රචාරණය, වෙළඳපොල සොයා ගැනීම පිළිබදව ද අවධානය යොමු කළ යුතුය.

5. අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ දැනට පිළිගෙන ඇති සේවාවන් කිසිදු වෙනස්කමකින් තොරව කාන්තාවන්ට සැපයීම හා අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රයේ කාන්තා ශ්‍රමිකයින්ගේ පවතින අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා නව ප්‍රතිපත්තීන් හා ක්‍රියාමාර්ග සකස්කිරිම ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ හා අධිකරණ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, ග්‍රාමිය ආර්ථික කටයුතු අමාත්‍යාංශය හා සියලුම පලාත් සභාහී ග්‍රාමීය සංවර්ධන, ආර්ථික සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශ පියවර ගත යුතුය

6. අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රවල නියුතු කාන්තාවන් ජාල ගත කිරීමට හා සමුපකාර සමිති වැනි සංවිධාන හරහා සංවිධානගත කිරීමට කටයුතු කිරීම. ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශ, සමුපකාර කටයුතු අමාත්‍යාශය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය, ග්‍රාමිය ආර්ථික කටයුතු අමාත්‍යාංශය හා සියලුම පලාත් සභාහී ග්‍රාමීය සංවර්ධන, ආර්ථික සංවර්ධන,සමුපකාර හා කාන්තා කටයුතු අමාත්‍යාංශ විසින් සිදු කළ යුතුය.

7. කාන්තාවන්ට වෙනස්කම් සිදු කරන නිතීන් හා ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීම. මෙහිදී ඉඩම් සංවර්ධන ආඥා පනතට කාන්තාවන්ට හිතකර සංශෝධන එක් කිරිමට අධිකරණ අමාත්‍යාංශයට හා ඉඩම් අමාත්‍යාංශයට නිර්දේශ කරන අතර වතු ආශ්‍රිත සේවිකාවන්ගේ වේතන හා දීමනාහි පවතින විෂමතා ඉවත් කිරීමට කම්කරු හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශ වෙත නිර්දේශ කර සිටියි.

8. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළින් කාන්තාවන් වෙනස් කොට සැළකීමට එරෙහි ප්‍රබල ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම මෙන්ම දශක ගණනාවක් සාකච්ඡාවට භාජනයවූ කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කෙටුම්පත කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කම් පිටුදැකීමේ සම්මුතියේ සඳහන් රාමුව පාදක කොට ගෙන සම්මත කර ගැනීම. මේ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හා අධිකරණ අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගතයුතු වේ.

ඇමුණුම i

## ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම දායකත්වය

ශ්‍රී ලංකාව වර්තමානය වන විට දකුණු ආසියාතික රාජ්‍යක් වශයෙන් පෙර පැවති ආර්ථික තත්වයන් යම්තාක් දුරකට වර්ධනය කර ගැනීමට සමත්ව ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ පැවති තිස්වසරක යුද තත්වය හේතුවෙන් අඩාලව පැවති ලංකාවේ ආර්ථික තත්වය ශීඝ්‍ර වර්ධනයක් ලගා කර ගැනීමට 2017 වර්ෂය වන විට ශ්‍රී ලංකාව සමත් ව ඇත . ලංකාවේ ප්‍රධාන ආර්ථික අංශයන් වන්නේ සංචාරක කර්මාන්තය ,තේ අපනයනය ,නිමි ඇදුම් , සහල් නිෂ්පාදනය හා කෘෂිකර්මාන්තය යන අංශයන්ය.

ලංකාවේ ශ්‍රම බලකායට දායක වන ජනසංඛ්‍යාව අනුව අනුපාතිකය 2011 සිට 2017 පළමු කාර්තුව දක්වා ස්ත්‍රී , පුරුෂ වශයෙන් පහත පරිදි වගු ගත කල හැකිය.ඒ අනුව , කාන්තා ශ්‍රම බලකාය වර්ධනය පිළිබද සුළු වර්ධනයක් දැකිය හැකිය . නමුත් , සෑම වර්ෂයකදීම (2011-2017 පළමු කාර්තුව දක්වා ) පුරුෂ ශ්‍රම දායකත්වය කාන්තා ශ්‍රම දායකත්වයට වඩා වැඩි අගයක් ගෙන ඇති බව මනාව පැහැදිලිය .

**ශ්‍රී ලංකා ශ්‍රම බලකායට දායක වන ස්ත්‍රී පුරුෂ අනුපාතය**

| වර්ෂය | සමස්ත ජනගහනයෙන් ශ්‍රම බලකායට අයත් ප්‍රතිශතය | පුරුෂ (%) | ස්ත්‍රී (%) |
|---|---|---|---|
| **2011** | 52.9 | 74.0 | 34.3 |
| **2012** | 52.5 | 74.9 | 32.9 |
| **2013** | 53.7 | 74.9 | 35.4 |
| **2014** | 53.2 | 74.6 | 34.6 |
| **2015** | 53.8 | 74.7 | 35.9 |
| **2016** | 54.1 | 75.1 | 36.0 |
| **2014 Q1** | 53.4 | 74.4 | 35.3 |
| **2015 Q1** | 53.5 | 73.8 | 36.3 |
| **2016 Q1** | 54.1 | 75.5 | 36.3 |
| **2017 Q1** | 54.7 | 75.1 | 37.6 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2017 පළමු කාර්තු වාර්තාව

(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

ඉහත වගුව සළකා බලන කල පෙනී යන පැහැදිලි කරුණක් වන්නේ සමස්ත ශ්‍රී ලාංකේය ජනගහනයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් දක්වා ඇති සෑම වර්ෂයක ම ශ්‍රම බලකායට අයත්ව සිටින බවයි. එම ශ්‍රම බලකාය තුළ ස්ත්‍රී සහ පුරුෂ ප්‍රතිශත මට්ටම් ඉන් අනතුරුව දක්වා තිබේ. සමස්තයක් වශයෙන් ගත් කල ශ්‍රම බලකායට දායක වන කාන්තා ප්‍රතිශතය මෙන් දෙගුණයක පුරුෂ සහභාගිත්වයක් සෑම වසරකම දක්නට ලැබේ. නමුත් 2014 වර්ෂයේ සිට කාන්තා ශ්‍රම දායකත්වය අඛණ්ඩ වර්ධනයක් දක්වන බව පෙනේ.

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 2009 දත්ත වලට අනුව , එක් එක් අංශ අනුව පහත පරිදි වේ .

කෘෂිකර්මාන්තය - 32.7%

කර්මාන්ත - 26.3%

අනෙකුත් සේවා - 58%පරිදි වේ .


2015 නිමානයන් ට අනුව ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 4.79 ක වර්ධනයක් ලගාකරගෙන ඇත.

ලංකාව එක්සත් ජාතින් ගේ සංවිධානයේ එක් රටක් වශයෙන් තිරසාර සංවර්ධනය ලංකාව තුල ඇති කරගැනීම සඳහා ප්‍රධාන වශයෙන් උත්සුක වෙයි. ඒ අනුව , ලංකාව තුල තිරසාර සංවර්ධනය යන අරමුණ සාක්ෂාත් කරගැනීම කෙරෙහි ලංකාවේ ශ්‍රම දායකත්වය ඉතා වැදගත් වෙයි. මෙහිදී , ලංකාවේ ශ්‍රම දායකත්වය දෙස සංසන්දනාත්මකව අධ්‍යනය කළහොත් එහි වර්ධනයක් ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක වර්ධනයක් දැකිය හැකිය .ඒ අනුව, ශ්‍රී ලංකාවේ ශ්‍රම දායකත්වය 2017 වර්ෂයේ පළමු කාර්තුව තුල 54.7% කි . ගණනය කිරීම් වලට අනුව ශ්‍රී ලංකාවේ ගෘහ සේවයේ නියුතු අවුරුදු 15 ට වැඩි ගණන 2017 වර්ෂයේ පළමු කාර්තුව වන විට මිලියන 15.7ක් ලෙස දැක්වෙන අතර එය 2016 වර්ෂය හා සසඳා බලන කල මිලියන 0.3 ක වැඩිවීමක් පෙනුම් කරයි.2017 වර්ෂයේ පළමු කාර්තුව තුල කරන ලද අධ්‍යනයන් තුල ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි සංඛ්‍යාව මිලියන 8.6කි. එම සංඛ්‍යාවෙන් 62.7% ක් පුරුෂ වශයෙන් ද , 37.3% ක් ස්ත්‍රී වශයෙන්ද බෙදා වෙන්කළ හැකිය. ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාශීලි සංඛ්‍යාව නාගරික , ග්‍රාමීය , වතු ආශ්‍රිතව ගතහොත් එම සංඛ්‍යාව පහත පරිදි දැක්විය හැකිය.

| අංශය | | ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය | | | | |
|---|---|---|---|---|---|---|
| | එකතුව | % | පුරුෂ | % | ස්ත්‍රී | % |
| ශ්‍රී ලංකාව | 8,583,082 | 100.0 | 5,381,244 | 62.7 | 3,201,838 | 37.3 |
| නාගරික | 1,417,031 | 100.0 | 914,609 | 64.5 | 502,423 | 35.5 |
| ග්‍රාමීය | 6,732,711 | 100.0 | 4,241,120 | 63.0 | 2,491,591 | 37.0 |
| වතු | 433,340 | 100.0 | 225,516 | 52.0 | 207,824 | 48.0 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2017 පළමු කාර්තු වාර්තාව

(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)




මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2017 පළමු කාර්තු වාර්තාව

(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

ශ්‍රී ලංකාවේ ශ්‍රම දායකත්වය 2017 දෙවන කාර්තුව තුල විවිධ අංශයන් තුල අධ්‍යයනය කලහොත් කෘෂිකාර්මික , කර්මාන්ත හා සේවා යන අංශයන් තුල නියුතු සංඛ්‍යාව පහත සදහන් වගුව අනුව නිරූපණය වේ .මෙමගින් 2017 පළමු හා දෙවන කාර්තුව විග්‍රහ කෙරේ.2017 දෙවන කාර්තුව තුල රැකියාවන්හි නියුතු සේවක සංඛ්‍යාව මිලියන 8.1 ක් පමණ වන අතර ඉන් 45.7%ක් විවිධ සේවා අංශ වලද , 28.3 %ක් විවිධ කර්මාන්ත වලද , 26.0%ක් කෘෂිකර්මයෙහි ද නියුතු පුද්ගලයන් වේ .

| කාර්තුව | ශ්‍රී ලංකාව | ප්‍රධාන සේවා අංශ | | |
|---|---|---|---|---|
| | | කෘෂිකර්මය | සේවා අංශය | කර්මාන්ත |
| **2017 Q1** | 8,230,207 | 2,221,761 | 2,306,398 | 3,702,049 |
| **2017 Q2** | 8,138,728 | 2,114,336 | 2,301,377 | 3,723,015 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2017 පළමු හා දෙවන කාර්තු වාර්තා

(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික , කර්මාන්ත හා සේවාවන්හි නියුතු ජනගහනය ස්ත්‍රී හා පුරුෂ වශයෙන් ගතහොත් ඉන් වැඩි ප්‍රමාණයක් සේවා අංශයන්හි නියුතු බව පැහැදිලිවේ . ඒ අනුව , මෙහි කෘෂිකාර්මික කටයුතු සඳහා කාන්තා ශ්‍රම දායකත්වය 28.8% ක් වන අතර විවිධ කර්මාන්තයන්හි නියුතු කාන්තා ශ්‍රම දායකත්වය 27.4%ක් වේ.තවද, අනෙකුත් සේවාවන්හි නියුතු කාන්තා ශ්‍රම දායකත්වය 43.9%කි.

| ප්‍රධාන කර්මාන්ත අංශ | ශ්‍රී ලංකාව | ස්ත්‍රී /පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| ශ්‍රී ලංකාව | 100.0 | 100.0 | 100.0 |
| **කෘෂිකර්මාන්තය** | 26.0 | 24.5 | 28.8 |
| **කර්මාන්ත** | 28.3 | 28.7 | 27.4 |
| **වෙනත් සේවා** | 45.7 | 46.7 | 43.9 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2017 පළමු කාර්තු වාර්තාව

(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනය හා පුරුෂ ජනගහනය වශයෙන් ගත් කල එයින් විවිධ රැකියාවල් වල නියුතු සේවකයන් ගණන 2015 දත්තයන්ට අනුව පහත ආකාරයට දැක්විය හැකිය . එහිදී නිල නොවන රැකියා වල නියුතු එනම් , අත්කම් හා අනෙකුත් කර්මාන්ත වල නියුතු සේවකයන් අතරින් 34.9% ක් කාන්තා ශ්‍රමය බව පැහැදිලිය .කළමනාකරණ සේවය, නීති සම්පාදන කාර්යයන් හි නියුතු කාන්තා දායකත්වය 25.9% කි . විවිධ රැකියාවන් හි නියුතු කාන්තා දායකත්වය 65.8% කි . තාක්ෂණික සේවා තුල රැකියා නියුක්තිකයන් අතර කාන්තා දායකත්වය 32.2%ක් වන අතර ලිපිකරුවන් වශයෙන් සේවය කරන රැකියා නියුක්තිකයන් අතර කාන්තා දායකත්වය 51.8කි .වෙළඳ සහයකයන් වශයෙන් සේවය

කරන සේවා නියුක්තිකයන් අතර කාන්තා දායකත්වය 31.3% කි. කෘෂිකාර්මික , ධීවර ආශ්‍රිත රැකියා කරන සේවා නියුක්තිකයන් අතර කාන්තා දායකත්වය 33.8%කි . තවද , අත්කම් ආශ්‍රිත රැකියාවන්හි නියුතු සේවනියුක්තිකයන් අතර කාන්තා දායකත්වය 34.2% කි .වතු ආශ්‍රිත රැකියා කරන සේවා නියුක්තිකයන් අතර කාන්තා ශ්‍රම දායකත්වය 14.3%ක් වන අතර ආරම්භක රැකියාවන්හි නියුතු කාන්තා දායකත්වය 37.7% කි.හමුදා සේවයේ නියුතු කාන්තා දායකත්වය 12.6% ක් ලෙස දැක්වේ.

| රැකියාව | එකතුව | ස්ත්‍රී / පුරුෂ භාවය | | සමස්ථ කාන්තා දායකත්වය (%) |
|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | |
| එකතුව | 100.0 | 100.0 | 100.0 | 34.9 |
| කළමනාකරණ සේවය, නීති සම්පාදන කාර්යයන් | 6.1 | 7.0 | 4.6 | 25.9 |
| විවිධ රැකියාවන් | 6.5 | 3.4 | 12.3 | 65.8 |
| තාක්ෂණික සේවා | 6.0 | 6.3 | 5.6 | 32.3 |
| ලිපිකරුවන් | 4.0 | 2.9 | 5.9 | 51.8 |
| වෙළඳ සහයකයන් | 10.9 | 11.5 | 9.8 | 31.3 |
| කෘෂිකාර්මික , ධීවර ආශ්‍රිත රැකියා | 18.6 | 18.9 | 18.0 | 33.8 |
| අත්කම් ආශ්‍රිත රැකියාවන්හි | 16.2 | 16.3 | 15.8 | 34.2 |
| වතු ආශ්‍රිත රැකියා | 8.6 | 11.3 | 3.5 | 14.3 |
| ආරම්භක රැකියාවන්හි | 22.6 | 21.6 | 24.3 | 37.7 |
| හමුදා සේවය | 0.5 | 0.7 | 0.2 | 12.6 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2015 වාර්ෂික වාර්තාව
(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

2017 දෙවන කාර්තුව වනවිට විරැකියා මට්ටම පිළිබඳ සලකා බැලුවහොත් සමස්තයක් වශයෙන් 380,594 කි. 2017 මුල් කාර්තුව තුල විරැකියාව 4.5% ක් ලෙස ගණනය කෙරුණු දත්තයන්ට අනුව දැක්වෙයි. 2017 වර්ෂයේ දෙවන කාර්තුව දෙස බලනවිට විරැකියාවෙන් පෙළෙන ජනගහනයෙන් 7.1%ක් කාන්තාවන් වන අතර 3.0%ක් පුරුෂ පක්ෂය වේ .තරුණ රැකියා විරහිත ජනගහනය අනුව 2017 දෙවන කාර්තුව වන විට එය 20.0%කි .දත්තයන් ට අනුව රැකියා විරහිත පුරුෂ ජනගහනයට සාපේක්ෂව රැකියා විරහිත කාන්තා ජනගහනය විශාල බව පෙනී යයි . ඒ අනුව කාන්තා රැකියා විරහිත ජනගහනයෙන්ද තරුණ කාන්තා රැකියා විරහිත ජනගහනය වැඩි අගයක් ගැනෙන බව මෙම දත්තයන් සලකා බැලීමේදී පෙනී යයි

| වයස් මට්ටම ( අවුරුදු ) | ශ්‍රී ලංකාව | රැකියා විරහිත අනුපාතය | | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ශ්‍රී ලංකාව | ස්ත්‍රී /පුරුෂ භාවය | |
| | | රැකියා විරහිත අනුපාතය | පුරුෂ | ස්ත්‍රී |
| ශ්‍රී ලංකාව | 380,594 | 4.5 | 3.0 | 7.1 |
| 15-24 | 190,685 | 20.0 | 14.8 | 29.1 |
| 25-29 | 96,763 | 11.3 | 7.7 | 17.0 |
| 30 ට වැඩි | 93,146 | 1.4 | 0.8 | 2.4 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2017 දෙවන කාර්තු වාර්තාව
(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

අධ්‍යාපන සුදුසුකම් අනුව ශ්‍රී ලංකාවේ රැකියා විරහිතභාවය අනුව වැඩිම රැකියා විරහිත ප්‍රමාණය අ .පො.ස . උසස්පෙළ සමත් ජනගහනයෙන් 8.2% කි . ඒ අතරින් 5.0%ක් පුරුෂන් වන අතර 11.8%ක් කාන්තාවන් වේ.

| අධ්‍යාපන මට්ටම | ශ්‍රී ලංකාව | රැකියා විරහිත අනුපාතය | | |
|---|---|---|---|---|
| | | ශ්‍රී ලංකාව | ස්ත්‍රී /පුරුෂ භාවය | |
| | සංඛ්‍යාව | රැකියා විරහිත අනුපාතය | පුරුෂ | ස්ත්‍රී |
| ශ්‍රී ලංකාව | 380,594 | 4.5 | 3.0 | 7.1 |
| අ.පො.ස.සාමාන්‍යපෙළට අඩු | 144,924 | 2.7 | 2.0 | 4.3 |
| අ.පො.ස . සාමාන්‍යපෙළ සමත් | 87,161 | 6.0 | 4.9 | 8.3 |
| අ.පො.ස . උසස්පෙළ හා ඉන් ඉහල | 148,509 | 8.2 | 5.0 | 11.8 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2017 දෙවන කාර්තු වාර්තාව
(ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

ඒ අනුව, ලංකාව තුල කාන්තා ශ්‍රම දායකත්වය පුරුෂ ශ්‍රම දායකත්වයට වඩා පහල මට්ට්ටමක් ගැනෙන බව නිගමනය කල හැකිය. එමෙන්ම , ශ්‍රී ලංකාව තිරසාර සංවර්ධනය කරා ගමන් කිරීමේදී මෙම ප්‍රවනතාව යෝග්‍යනොවේ .

ඇමුණුම ii

ජාත්‍යන්තර කාන්තා දින වටමේස සාකච්ඡාවට සහභාගී වූ පිරිස

| නම | තනතුර සහ ආයතනය |
|---|---|
| එස්. ආර්. නිලූකා පෙරේරා | යහපත් එඬේරාගේ කන්‍යාරාමය |
| නූර් රිස්නා අනීස් | බාහිර සම්පත් පිලිබඳ දෙපාර්තමේන්තුව |
| පී. කේ. තිශාරි | දාබිඳු කලෙක්ටිව් |
| රෝෂිනී වීරසිංහ | දාබිඳු කලෙක්ටිව් |
| බිම්ශානි ආරච්චි | පොලිස් දෙපාර්තමේන්තුව |
| R.P.N.N . විජේදෝරු | ශ්‍රී ලංකා නාවික හමුදාව |
| ඒ. කේ. ගුණසේකර | ජාතික සැලසුම් පිලිබඳ දෙපාර්තමේන්තුව |
| ඒ. එන්. ආර්. වීරසේකර | වැඩබලන අධ්‍යක්ෂක, නිවාස ඉදිකිරීම් අමාත්‍යංශය |
| සුරේකා ඩයස් | අධ්‍යක්ෂක (නීති), ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| එල්. කේ. එල්. වයි. ලේකම්වසම් | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| ආර්. එම්. අයි.රත්නායක | අතිරේක ලේකම්, මහජන පරිපාලනය පිලිබඳ අමාත්‍යංශය |
| S .H .A .N .D . ආරියරත්න | තැපැල්, තැපැල් සේවා හා ඉස්ලාම් ආගමික සම්බන්ධතා අමාත්‍යංශය |
| ඩී. ටී. එන්. මුණසිංහ | ශ්‍රී ලංකා යුධ හමුදාව |
| ඩබ්ලිව්. ඒ. පී. වෙල්ලප්පුලි | අධ්‍යක්ෂ, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ මාධ්‍ය අමාත්‍යංශය |
| සජීවනී අබේකෝන් | නීති නිලධාරි, නීති ආධාර කොමිසම |
| එස්. පී. නවරත්න | සහකාර කොමසාරිස්, කම්කරු දෙපාර්තමේන්තුව |
| හෙයින්ස් වෝකර් නෙඩර්කෝන් | තානාපති, ස්විස් තානාපති කාර්යාලය |
| ප්‍රියන්ති පෙරේරා | කොමර්ෂල් බැංකුව |
| එස්. එම්. පී. කේ. වීරසේකර | සහකාර කොමසාරිස්, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව |
| සමන්ති බණ්ඩාර | පොලිස් අධ්‍යයන ආයතනය |
| ආර්. පී. කස්තුරිආරච්චි | සහකාර අධ්‍යක්ෂ (කෘෂිකර්ම), කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය |
| වයි. එම්. ගුණසිංහ | සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන), අධ්‍යාපන අමාත්‍යංශය |
| හෂිනි රාජරත්න | සම්බන්ධීකාරක මානව අයිතිවාසිකම් ආයතනය |
| ඩී. වී. එස්. දයාවංස මිය | අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන අංශය, ශ්‍රී ලංකා මහා බැංකුව |
| කේ. ඩී. එස්.පී. පෙරේරා | සහකාර අධ්‍යක්ෂ, සෞඛ්‍ය අමාත්‍යංශය |
| මනෝමි ඩි සිල්වා | ව්‍යාපෘති සහය නිලධාරි (ස්වේච්ඡා), එක්සත් ජාතීන්ගේ සංගමය |
| විජිත සෙනෙවිරත්න | අතිරේක ලේකම්, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යංශය |
| දමිත් චන්දිමාල් | උපදේශක, ඉන්ෆෝර්ම් මානව හිමිකම් ලියවිලි මධ්‍යස්ථානය |
| ඩබ්ලිව්. එම්. ඒ. පී. බී. වන්නිනායක | අතිරේක ලේකම් |
| කුනියොෂි | ජපන් තානාපති කාර්යාලය |
| ඉශානි මහේෂා සමරතුංග | සාර්ක් සංස්කෘතික මධ්‍යස්ථානය |
| වී. වනිගසේකර | සහකාර අධ්‍යක්ෂක, තිරසාර සංවර්ධන සහ වනජීවී අමාත්‍යංශය |
| එච්. සී. කන්නන්ගර | පශු වෛද්‍ය, ග්‍රාමීය ආර්ථික අමාත්‍යංශය |
| වයි. ඇල්ලෙපොල | පොලිස් අධ්‍යයන ආයතනය |
| ඩී. එල්. දීපානි ප්‍රියංකා | සහකාර අධ්‍යක්ෂ, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ පුනරුත්තාපන හා නැවත පදිංචි කිරීමේ අමාත්‍යංශය |

| | |
|---|---|
| එන්. ඒ. ආර්. නෙත්තසිංහ | විදුහල්පති, හෙද විද්‍යාලය, කොළඹ |
| එන්. හපුහින්න | සහකාර කොමසාරිස්, ඉඩම් කොමසාරිස් ජෙනරාල් දෙපාර්තමේන්තුව |
| ෂෙලී වයිටින් | මහ කොමසාරිස් , කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලය |
| කුමුදුනී සැමුවෙල් | කාන්තා හා මාධ්‍ය එකතුව, කොළඹ |
| ඉශානි අබේරත්න | අධ්‍යක්ෂ, (වාණිජ) කර්මාන්ත හා වාණිජ අමාත්‍යංශය |
| තිස්ස ජයසිංහ | බන්ධනාගාර කොමසාරිස් |
| ප්‍රියන්ත ජයකොඩි | අතිරේක පරීක්ෂක ජෙනරාල්, ශ්‍රී ලංකා පොලිසිය |
| රොෂාන් ද සිල්වා | LGBTI ක්‍රියාධරයෙක් |
| එච්. සී . ඩී. ද සොයිසා | නීති නිලධාරී, කාන්තා හා ළමා අමාත්‍යංශය |
| එස්. බාලසුබ්‍රමනියම් | අතිරේක ලේකම් , සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන අමාත්‍යංශය |
| ආර්. ඒ. පෙරේරා | අධ්‍යක්ෂ, පොදු කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශය |
| කේ. ගුණවර්ධන | ඉඩම් අමාත්‍යංශය |
| එස්. චන්නිආරච්චි | පවුල් සංවිධාන සංගමය |
| චාමර සම්පත් | ඊක්වල් ග්‍රවුන්ඩ්, කොළඹ |
| පියානි කුමාරි | නීති ආධාර කොමිසම |
| නදී ධර්මසිරි | සම්පත් බැංකුව |
| එම්.පී.රන්දෙණිය | සහකා සාමාන්‍ය අධිකාරි, විදේශසේවා නියුක්ති කාර්යංශය |
| ෂෙලෝමි ගුණවර්ධන | අධ්‍යක්ෂ (සන්නිවේදන), ශ්‍රී ලංකා මහ බැංකුව |
| ආචාර්ය එස්. එම්. පී. චන්ද්‍රා පද්මිණි | ජ්‍යෙෂ්ඨ නිලධාරී, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා සභාව |
| එස්. චාමර | සහකාර ව්‍යාපෘති නිලධාරී, ඊක්වල් ග්‍රවුන්ඩ් |
| කේ. කුමාරසිංහ | සහකාර කොමසාරිස්, සුරාබදු දෙපාර්තමේන්තුව |
| අමල්කා එදිරිසිංහ | අධ්‍යක්ෂ (වැඩසටහන්), පවුල් පුනරුත්තාපන මධ්‍යස්ථානය |
| චන්ද්‍රමාලි ලියනගේ | අධ්‍යක්ෂ, ජාතික ශිල්ප සභාව |
| රජ්මි මණතුංග | සහකාර අධ්‍යක්ෂ, විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශය |
| කුමුදිනී ශ්‍රියානි වෙඩිසිංහ | පුහුණු නිලධාරී, සමාජ සංවර්ධනය පිළිබඳ ජාතික ආයතනය |
| එම්. එස්. චමිඳු ඩි සිල්වා | හෙල්ප්ඒජ් ශ්‍රී ලංකා |
| ආර් එම් පී ජයතිස්ස | සහකාර සාමාන්‍යාධිකාරි ශ්‍රී ලංකා කජු සංස්ථාව |
| එන් ඒ පී නිස්සංක | අතිරේක අධ්‍යක්ෂ, සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන අමාත්‍යංශය |
| ඒ ආර් එම් ෆර්සන් | ව්‍යාපෘති සහකරු, කම්කරු සංවිධානය |
| සුනිමලී මදුරාවල | ව්‍යාපෘති නිලධාරී, පොලිස් පුහුණු ආයතනය |
| මේනකා ෂන්මුගලිංගම් | කළමනාකරු, මානව අයිතිවාසිකම් ආයතනය |
| අයුලි ඩි සිල්වා | අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්, ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| තේනු රන්කෙත් | සභාපති, වෙනස සංවිධානය, කොළඹ |
| වෛද්‍ය ජේ විදානපතිරණ | සෞඛ්‍ය අමාත්‍යංශය |
| සංජීව ගමගේ | ස්ටෑන්ඩ්අප් මූව්මන්ට්, කොළඹ |
| භූමි හරේන්ද්‍රන් | යන් අවුට් හියර්, කොළඹ |
| බී.ඒ. දමයන්ති | සහකාර පාලනාධිකාරි, ආගමන විගමන දෙපාර්තමේන්තුව |
| බී. එම්. වීරසූරිය | අධ්‍යාපන අධ්‍යක්ෂ |
| එන්. ප්‍රනාන්දු | සම්පත් බැංකුව |
| ආචාර්ය මල්ලිකාන්ති | ඩී. ඒ.ටී .සී.ඩී. |
| ජී.ඒ. රසිකා පෙරේරා | කම්කරු හා වෘත්තීය සමිති සම්බන්ධතා අමාත්‍යංශය |
| සුලෝචනා විජයසිංහ | (ස්වේච්ඡා),එක්සත් ජාතීන්ගේ සංගමය |

Printing Funded by

EU-Sri Lanka
සංවර්ධන සහයෝගිතාව
அபிவிருத்திக்கான ஒத்துழைப்பு
Development Cooperation

ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැගීම සඳහා උත්ප්‍රේරක සහය
இலங்கையில் சமாதானத்தை கட்டியெழுப்புவதற்கான ஊக்க உதவி
Catalytic Support to Peacebuilding in Sri Lanka

Printed by, **Horizon Printing (Pvt) Ltd.**